# රණවරුණ

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ ප්‍රකාශනයකි

38 වන කලාපය
2021 අප්‍රේල් - ජූනි

RANAWARUNA




## හෙට දවස වෙනුවෙන් අද දවස කැපකරමු ...

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා වත්මන් සේනාවිධායකතුමන්ගේ උපදෙස් හා මඟපෙන්වීම මත නියෝජ්‍ය සේනාවිධායකතුමන්ගේ අධීක්ෂණය යටතේ ස්වේච්ඡා සාමාජිකයන්ගේ ශ්‍රමදායකත්වය තුළින් ඉදිවන නව කඳවුරු පරිශ්‍රය.

## අධීක්ෂණය



මේජර් ජෙනරාල්
ජේ ඩී සී පී ජයසිංහ කේඑස්වී කේඑස්පී

## උපදේශකත්වය



බ්‍රිගේඩියර්
එස් එන් සමරවික්‍රම කේඑස්පී



කර්නල්
යූ කේ වික්‍රමාරච්චි

## සංස්කාරක



ලුතිනන් කර්නල්
එස් රාජපක්ෂ ශ්‍රීලංජාආබමු

## රණවරුණ කාර්ය මණ්ඩලය

මේජර් ජේ පී ටී එස් ජයසිංහ ශ්‍රීලංජාආබමු (සම්බණ්ධීකරණය)
කපිතාන් ඩී එම් දිල්හාරා සජීවනී ජාශීබ (සෝදුපත් කියවීම)

සැරයන් දයාරත්න ඩීපීඑස් (පිටු සැකසුම)
කෝප්‍රල් කීර්තිරත්න ඒඑච්ටීඑස්එස් (පරිගණක නිමැවුම්)

ලා/කෝප්‍රල් කරුණාතිලක ඒඑම් (ඡායාරූප)
ලා/කෝප්‍රල් තෙවරප්පෙරුම අයියු (ඡායාරූප)



## රණවරුණ ලිපිනය

සංස්කාරක,
රණවරුණ
ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මූලස්ථානය
යුද්ධ හමුදා කඳවුර,
සාලාව කොස්ගම

ඊමේල් ranawaruna@yahoo.com

දුරකථන 036 2255 362

ෆැක්ස් 036 2255 709

වෙබ් slavf@army.lk



මුද්‍රණය
නියෝ ග්‍රැෆික්ස්


# සංස්කාරක සටහන

ඉන්දියන් සාගරයේ පිහිටි ශ්‍රී ලංකාව නම් වූ මේ දිවයිනට ද ලොව අන්‍ය රටවලට මෙන්ම විවිධ අයුරින් විකෘතීන් දක්වමින් ප්‍රභේදනය වන කොවිඩ් වෛරසය හමුවේ යම් ආකාරයක ආර්ථික සමාජීය වශයෙන් පසුබෑමකට ලක්වීමට සිදුවී ඇති බව අවිවාදයෙන් යුක්තව පිළිගත යුත්තකි. වසර දෙකකට ආසන්න කාලපරිච්ඡේදයක් තුළ විවිධ බාධා හැලහැප්පීම් පැවතුනද කෙසේ හෝ ජනජීවිතය පවත්වාගෙන යෑමට අපට සිදුවූ බව සත්‍යයකි.

එක් අතකින් පාසල් පවත්වාගෙන යාමට ඇති දුෂ්කරතාව නිසා දූ දරුවන් තම නිවෙස්වලට කොටුවීමෙන් සිය මානසික තත්වය වෙනස් වී ආතතිමය ලක්ෂණ නිරීක්ෂණය වන බව, සමාජීය පර්යේෂකයන්ගේ අදහසයි. එපමණක් නොව එදිනෙදා තම ජීවිකාව කරගෙන යන බොහෝමයක් දෙනා සේම ව්‍යාපාර කටයුතු මෙන්ම සේවා සපයන රැකියාවල නිරත පිරිස් වෙතද කොවිඩ් 19 වෛරසය විසින් එල්ලකරන ලද්දේ මරු පහරකි.

තත්වය එසේ වුවත් ලොව ඇතැම් රටවල කොවිඩ් වෛරස මර්ධන එන්නත් ලබාදීමේ සැලසුමක් පෙනෙන තෙක් මානයේ හෝ නොමැති අවස්ථාවක, රටක් ලෙස අප සැලසුම් සහගතව කොවිඩ් මර්ධන එන්නත්කරණ වැඩසටහන දීපව්‍යාප්තව ක්‍රියාත්මක කරන්නෙමු. එනම් සැප්තැම්බර් මස අගදී වයස අවුරුදු 30 ට වැඩි සියලුම ශ්‍රී ලාංකිකයන්ට එන්නත්කරණය කිරීමේ ඉලක්කය තුළ අප සීඝ්‍ර ගමනක යෙදී සිටින අතර, එම ඉලක්ක ඉටුවී කොවිඩ් මරණ අඩුවනු දැකීම රටවැසියන් වන අප සියලු දෙනාගේම ඒකායන බලාපොරොත්තුවයි.

කෙසේ නමුත් රට තුළ නීතිවිරෝධී ක්‍රියාකරකම්වල යෙදුන අයටද නීරෝධායන රීති, පලාත් සීමා ආදිය නිසාවෙන් එම ක්‍රියාකාරකම්වල රිසිසේ යෙදීමට නොහැකි විය. ඒ නිසාම රට ඉදිරියේදී යථාතත්වයට පත්වීමේදී ඔවුන්ද එම සමාජ විරෝධී ක්‍රියාවන් දෙගුණ තෙගුණ කොට සූක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීමට උත්සාහ ගනු ඇත. මෙහිදී නීති විරෝධී ව්‍යාපාරිකයන්ගේ ඉලක්ක බවට නිරෝධායන සීමාවන් යටතේ නිවසටම කොටුවූ දරු දැරියන් පත්වීමට බොහෝ සෙයින් ඉඩ ඇත. විශේෂයෙන්ම ජංගම දුරකථන භාවිතයෙන් අධ්‍යාපන කටයුතුවල නිරත වන අතරතුර අහිංසක දරු දැරියන් සමාජ විරෝධී ක්‍රියාකාරකම් සඳහා පොළඹවා ගැනීමේ ඉඩකඩද එමටය. එනිසා තම දරුවන්ගේ කටයුතු පිළිබඳව විමසිලිමත්ව ක්‍රියාකළ යුතුය. මන්දයත් මල් කැකුළු වන් ජාතියේ අනාගතය හිමි දුවා දරුවන්ගේ අනාගත සුරක්ෂිතභාවය උදෙසා දෙමාපියන් ලෙසත් යුද්ධ හමුදා සාමාජිකයන් ලෙසත් පෙරමුණ ගෙන ක්‍රියාකරමින් අවධානයෙන් පසුවිය යුතු කාලයක් එළඹ ඇති බැවිනි.



# සෙබළ පහසුකම් වැඩිදියුණු වෙමින් ...





ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ අභිනවයෙන් ඉදිකළ බහුකාර්ය සම්පත් ගොඩනැගිල්ල ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් කේ එන් එස් කොටුවේගොඩ එන්ඩීසී අයිජී ගේ සුරතින් විවෘතවීම ජුනි මස 01 වන දින පෙරවරු 1029 ට යෙදුණු සුබ මොහොතින් සිදු විය.

ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ රාජකාරී කටයුතුවල නිරත සියලුම නිලධාරීන් සහ සෙසුනිල සාමාජිකයින්ගේ ප්‍රයෝජනය සඳහා වූ ජන අවන්හලක්, මැහුම්හලක්, කරණවෑම්හලක් රෙදි සේදුම්හලක් මෙම ගොඩනැගිල්ල තුළ ස්ථාපනය කරමින් සිය පහසුකම් පරිපූර්ණ කර ඇත. මෙම අවස්ථාවට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් ජේ ඩී සී ජී ජයසිංහ කේඑස්වී කේඑස්පී ඇතුළු ස්වේච්ඡා බළසේනා මූලස්ථාන කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් මෙන්ම සෙසුනිල සාමාජිකයන්ද සෞඛ්‍යාරක්ෂිත පිළිවෙත් අනුගමනය කරමින් මේ සඳහා සහභාගි වන ලදී.




# ස්වේච්ඡා බළසේනා මූලස්ථානයට අභිමානවත් පිවිසුම් දොරටුවක්



යුද්ධ හමුදා කඳවුරක පැවතිය යුතු ආවේණික මෙන්ම අත්‍යවශ්‍ය අංග සහිත පරිශ්‍රයකට ප්‍රවේශවීමේ දී ප්‍රධාන දොරටුව සමස්ත කඳවුරටම ගාම්භීරත්වයක් ගෙන දෙන්නකි.

මීට වසර කිහිපයකට ඉහතදී සිදු වූ පිපිරීමෙන් පසු අභිනවයෙන් ඉදිවන ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථාන කඳවුරු පරිශ්‍රයට අඩුපාඩුවක්ව පැවැති පිවිසුම් දොරටුව ඉදිකිරීම සඳහා මංගල පස්පිඩැල්ල කපා, ශීලා ප්‍රතිෂ්ඨාපනය සිදුකිරීම ජූනි මස 02 දින ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් කේ එන් එස් කොටුවේගොඩ එන්ඩීසී අයිපී ජ්‍යේෂ්ඨ නිලධාරීතුමන්ගේ සුරතින් ආගමික වතාවත් මධ්‍යයේ සිදුවිය. මෙම අවස්ථාව සඳහා ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් ජේ ඩී සී ජී ජයසිංහ කේඑස්වී කේඑස්පී මෙන්ම මූලික මාණ්ඩලික නිලධාරි ඇතුළු අංශ ආයතනවල ජ්‍යේෂ්ඨ නිලධාරීන්ද සෙසුනිල සාමාජික පිරිසක්ද සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සහභාගී වූහ.




යෝජිත පිවිසුම් දොරටුව



# 2 (සේවි) වෛද්‍ය බළකායේ කඳවුරු සංචාරය ...







වසර 140 කට පෙර ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාව සිලෝන් වොලන්ටියර්ස් නමින් ආරම්භ කරන අවස්ථාවේදී 50 දෙනෙකුගෙන් යුත් ගිලන්මැසි කණ්ඩායමක් ලංකා ස්වේච්ඡා හමුදාවට ඇතුළත් විය. වෛද්‍ය බළකායේ ආරම්භක සලකුණ වුයේ එම කණ්ඩායමයි. 1881 ජුලි මස 29 වන දින ගිලන්මැසි කණ්ඩායමක් වශයෙන් ආරම්භ කරන ලද එම කණ්ඩායම පසුකාලීනව එනම් 1911 ජුනි මස 13 වන දින ලංකා වෛද්‍ය බළකාය ලෙස ස්ථාපිත විය.

එසේ ආරම්භ වෙමින් අභිමානවත් ඉතිහාසයකට හිමිකම් කියන වෛද්‍ය බළකායේ ස්වේච්ඡා බළසේනාවට අයත් එකම වෛද්‍ය ඒකකය වන 2 වන (ස්වේච්ඡා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකායේ කඳවුරු නිරීක්ෂණ සංචාරයක නිරතවීමට වත්මන් ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් කේ එන් එස් කොටුවේගොඩ එන්ඩීසී අයිපී වෙත පසුගියදා අවස්ථාවක් ලැබිණ. එහිදී එතුමන්ව ඒකක අණදෙන නිලධාරිණී මේජර් ආර් ඒ ඒ ඩබ්ලිව් විජයසිංහ ශ්‍රීලයුවෛබ විසින් යුද්ධ හමුදා සම්ප්‍රදායානුකූලව පිළිගනු ලැබූ අතර, එම අවස්ථාව සඳහා ඒකකයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වන බ්‍රිගේඩියර් පී පී වික්‍රමසූරිය, බ්‍රිගේඩියර් පී ටී ආර් මකුලොලුව, කර්නල් බී එල් රණසිංහ කේඑස්පී, කර්නල් ඒ බාලසූරිය, ලුතිනන් කර්නල් ඩබ්ලිව් ටී ටී ද සිල්වා යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ද සහභාගී වූහ.



# කඳවුරු සංචාරයක තතු ...

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ කීර්තිමත් මෙන්ම වර්ණලාභී රෙජිමේන්තුවක් වන ගැමුණු හේවා රෙජිමේන්තුවට අයත් ස්වේච්ඡා ඒකකයක් වන 14 (සෙව්) ගැමුණු හේවා බළඇණිය වෙත ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් කේ එන් එස් කොටුවේගොඩ එන්ඩීසී අයිපී ජ්‍යේෂ්ඨ නිලධාරීතුමන්ගේ කඳවුරු සංචාරයක් ජුලි මස 08 වන දින සිදුකරන ලදී. එහිදී ඒකක අණදෙන නිලධාරි මේජර් එස් ඒ අබේසේකර ගැහේබ විසින් එතුමන්ව යුද හමුදා සම්ප්‍රදායානුකූලව පිළිගනු ලැබූ අතර, මෙම අවස්ථාව සඳහා ආසේමු (බටහිර) යටතේ ස්ථාපිත ඒකකයන් වන 3 ගැහේබ අණදෙන නිලධාරී මේජර් ඩබ් ඒ කේ යූ චන්ද්‍රික ගැහේබ, 12 ඉසේරෙ අණදෙන නිලධාරී මේජර් කේ ඩබ්ලිව් ජී යූ එම් ගුණතිලක එල්එස්සී ඉසේරෙ, 2 ශ්‍රීලයුකෘපබ අණදෙන නිලධාරී මේජර් ඩබ්ලිව් ඒ එන් ඩී ජයසුන්දර විපාරෙ සහභාගී වූහ.

එහිදී සේනාවිධායකතුමන් විසින් එම බළඇණිවල වත්මන් තත්වය හා පාලන රාජකාරි පිළිබඳව සොයා බලා ඒකක අණදෙන නිලධාරීන්හට නිසි උපදෙස් ලබාදීමට කටයුතු කරන ලදී. එම අවස්ථාවට ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් ජේ ඩී සී පී ජයසිංහ කේඑස්වී කේඑස්පී හා පුහුණු පරීක්ෂක බ්‍රිගේඩියර් එස් එන් සමරවික්‍රම කේඑස්පී ද එක්වූහ.









# ලද උසස්වීම්වලට උණුසුම් සුබ පැතුම්



ස්වේච්ඡා බළසේනාවට අයත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ නිල සංයුතිය ඉහළ නැංවීමේ අවශ්‍යතාව මත ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානය විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාවට අනුව යුද්ධ හමුදාධිපතිතුමන්ගේ හා ආරක්‍ෂක ලේකම්තුමාගේ නිර්දේශය මත බ්‍රිගේඩියර් නිලය 7 ක්, කර්නල් නිලය 17 ක් හා ලුතිනන් කර්නල් නිලය 48 ක් වශයෙන් ජ්‍යෙෂ්ඨ නිල 72 ක ප්‍රමාණයක් අභිනව වශයෙන් ස්වේච්ඡා බළසේනාවට හිමි විය. ඒ අනුව ඇතිවූ නිල ඇබෑර්තු අනුව ස්වේච්ඡා බළසේනාවට අයත් කර්නල් නිලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 07 දෙනෙකු බ්‍රිගේඩියර් නිලයටද, ලුතිනන් කර්නල් නිලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 26 දෙනෙකු කර්නල් නිලයටද, මේජර් නිලයේ නිලධාරි 23 දෙනෙකු ලුතිනන් කර්නල් නිලයටද උසස් කිරීම සඳහා පසුගියදා අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමැතිය ලබා දෙන ලදී. එකවර නිල උසස්වීම් විශාල ප්‍රමාණයක් ලැබීම, වසර 140 ක ඉතිහාසය තුළ ස්වේච්ඡා බළසේනාවේ සුවිශේෂී වූ මොහොතක් ලෙස හැඳින්විය හැක.

ඒ අනුව බ්‍රිගේඩියර් නිලයට උසස්වීම් ලැබූ බ්‍රිගේඩියර් එන් ඩී පී ජයතිලක, බ්‍රිගේඩියර් ඩබ්ලිව් පී පී සිසිර කුමාර ආර්එස්පී, බ්‍රිගේඩියර් එම් ඩී බී එම් එස් ජයමාන්න, බ්‍රිගේඩියර් ඩබ්ලිව් ආර් ඩබ්ලිව් එම් එස් ආර් එම් බි වීරකෝන්, බ්‍රිගේඩියර් ඩී එච් කේ එස් විජේරත්න ආර්එස්පී, බ්‍රිගේඩියර් එම් ටී කේ ආර් සිල්වා කේඑස්පී, බ්‍රිගේඩියර් ඩබ්ලිව් එම් ඩී එස් කේ ගුණවර්ධන ආර්එස්පී කේඑස්පී, බ්‍රිගේඩියර් ජේ එම් එල් ජයසුන්දර ආර්ඩබ්ලිව්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පසුගිය ජුනි මස 25 දින ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේදී සේනාවිධායකතුමන් හමුවිය. එහිදී උසස්වීම් ලද ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත ස්වේච්ඡා බළසේනාවේ සියලුම සාමාජිකයන් වෙනුවෙන් සේනාවිධායකතුමන් විසින් සුභාශිංසන එක්කර සිටි අතර, ස්වේච්ඡා බළසේනාවේ ඉදිරි ක්‍රියාකාරකම් පිළිබඳ උපදෙස් ලබාදීමද සේනාවිධායක කාර්යාලය තුළදී සිදුකරන ලදී. මෙම අවස්ථාවට ස්වේච්ඡා බළසේනාවේ නියෝජ්‍ය සේනාවිධායකතුමන්ද සහභාගි විය.



# අසහාය විරු කැපකිරීම්වල සංවේදීත්වය






ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බළකායේ නිලධාරියෙකු වන මේජර් සුපිත් චමින්ද එදිරිසිංහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සම්පාදනය කරන රණවිරුවා සඟරාවෙහි ප්‍රධාන සංස්කාරක ලෙසද කටයුතු කරන අතර, ඔහු විසින් රචිත **“මරණය මැදින් මුලතිව් සිට”** සහ **“අවිබිමක ගිනියම”** යන ග්‍රන්ථ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් කේ එන් එස් කොටුවේගොඩ එන්ඩීසී අයිපී ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් වෙත සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් ජේ ඩී සී ජේ ජයසිංහ කේඑස්වී කේඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් වෙත පිළිගැන්වීම ජුනි 03 වන දින ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේදී සිදුකරන ලදී.



කොකාවිල් හි පිහිටි රූපවාහිනී සම්ප්‍රේෂණ මධ්‍යස්ථානයේ රාජකාරියේ නියුතුව සිටි කපිතාන් සාලිය අලදෙනිය ඇතුලු විරුවන් සිය ජීවිත පරිත්‍යාගයෙන් කළ අසහාය කැපකිරීම් හා බැඳුණු අප්‍රකට සත්‍ය කතාව අවිබිමක ගිනියම තුළින් චිත්‍රණය වේ. එසේම තිස් වසක යුද ඉතිහාසය තුළ ත්‍රස්තවාදය හමුවේ 1996 දී අප මුහුණ දුන් දරුණුතම ප්‍රහාරයක් වූ මුලතිව් ප්‍රහාරයේ දී බොහෝ විරුවන් පිරිසකගේ ජීවිත අප මාතෘභූමියට අහිමි වූ අතර එම ප්‍රහාරය හා බැඳුණු සංවේදී කතාපුවත මරණය මැදින් මුලතිව් සිට කෘතියේ අන්තර්ගතයයි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ නිලධාරියෙකු ලෙස රාජකාරි කිරීමෙන් ලත් අත්දැකීම් මෙන්ම වසර 03 ක පමණ කාලයක් තුළ කරන ලද පර්යේෂණාත්මක කරුණු ඇතුළත්ව මෙම කෘතීන් සම්පාදනය කර ඇති මොහුට තව තවත් නිර්මාණකරණයේ යෙදීමට රණවරුණ අපද මෙසේ සුබපැතුම් එක් කර සිටිමු.

## මතින් මිදීමට මනෝවිද්‍යාත්මක ප්‍රවේශයක් ..



ඇලන් කා විසින් රචිත **"The easy way to Control Alcohol”** නැමති ග්‍රන්ථය 2 (සෙවි) ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකායට අයත් මේජර් (වෛද්‍ය) ධනුෂ්ක නිරංග දිසානායක විසින් **“මධුලෝලිත්වය සුවකිරීමේ පහසු මග”** නමින් සිංහලට පරිවර්තනය කර ඇත. එය ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ජා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් කේ එන් එස් කොටුවේගොඩ එන්ඩිසී අයිපී වෙත පිළිගැන්වීම ජුලි මස 01 වන දින ස්වේච්ජා බළසේනා මුලස්ථානයේදී සිදුවිය.

වර්තමාන සාමාජය තුළ මතට ඇබ්බැහිවීම නිසා පුද්ගලයින් බොහෝ දෙනෙකු විවිධාකාර ගැටළුවලට මුහුණ දී ඇති අතර එයින් මිදී සුවපත් කායික මෙන්ම මානසික තත්වයක් සහිත ප්‍රීතිමත් ජීවිතයක් ගතකිරීමට මෙම මානෝවිද්‍යාත්මක ග්‍රන්ථය බෙහෙවින් ඉවහල් වනු ඇත. ශ්‍රී ලාංකීයන්ගේ යහපත් ජීවන පැවැත්ම වෙනුවෙන් මෙවැනි වූ නිර්මාණයන් තව තවත් සිදුකිරීමට ඔබට හැකි වේවායි රණවරුණ අපිද මෙසේ සුභාශිංසන එක්කර සිටිමු.

# ශාස්ත්‍රීය ප්‍රවේශයකින් "ලක්දිව සංග්‍රාම ඉතිහාසය"




ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවට අයත් නිලධාරියෙකු වන මේජර් සරත් ජයවර්ධන විසින් රචනා කරන ලද **"ලක්දිව සංග්‍රාම ඉතිහාසය"** ග්‍රන්ථය ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් කේ එන් එස් කොටුවේගොඩ එන්ඩීසී අයිපී ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් වෙත පිළිගැන්වීම ජුනි 25 වන දින ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේදී සිදුකරන ලදී. අනුරාධපුර මුල් අවධියේ සිට වන්නි මානුෂීය මෙහෙයුම දක්වා මෙරට යුද ඉතිහාසය පිළිබඳ තොරතුරු ඇසුරින් රචිත ඓතිහාසික ග්‍රන්ථයක් ලෙස **"ලක්දිව සංග්‍රාම ඉතිහාසය"** හැඳින්විය හැක.



මොහු විසින් පූර්වයෙන් රචනා කරන ලද **"වව්නියාවේ පුරාවිද්‍යා උරුමය"** නැමති ග්‍රන්ථයද නිසි අධ්‍යයන ක්‍රමවේද හරහා ශාස්ත්‍රීය ප්‍රවේශයකින් හා පුරාවිද්‍යාත්මක කෝණයකින් යුක්තව රචනා කර ඇති අතර, එයද එදින ස්වේච්ඡා බළසේනා සේනාවිධායකතුමන් වෙත පිළිගන්වන ලදී.

මේජර් සරත් ජයවර්ධන 1995 වර්ෂයේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුළත්ව සිය අධ්‍යයන කටයුතුවලින් අනතුරුව 1999 වර්ෂයේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවයට එක්වී ඇත. ඔහු 2008 වර්ෂයේදී කැළණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් උරුම කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද පසුව ශාස්ත්‍රපති උපාධිය ද සම්පූර්ණ කර ඇත.

වසර 22 කට ආසන්න සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ඔහු ස්වකීය රාජකාරියේ වගකීම ඉටුකරන අතරතුරම සිය ආචාර්ය උපාධිය සම්පූර්ණ කිරීම සඳහා වන අධ්‍යයන කටයුතුවල නියැළෙමින් සිටියි. එලෙස ඔහු ලබාගත් විෂය දැනුම හා යුද්ධ හමුදාවෙන් ලද පන්නරය තුළින් ග්‍රන්ථකරණයේ යෙදෙන ඔහුට රණවිරුණ කණ්ඩායමේ සුබපැතුම් මෙසේ එක් කර සිටිමු.



# දැණුම හා කැපවීම තුළින් මව්බිමට අභිමානය ...

පසුගිය ජනවාරි මස 13 වන දින සිට මාර්තු මස 06 වන දින දක්වා යුද හමුදා විද්‍යාපීඨය - ඉන්දියාවේදී (Indian Military Academy) පවත්වන ලද විදේශීය සරඹ උපදේශක පාඨමාලාව - 112 සඳහා 2 වන (සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුව නියෝජනය කරමින් සෙ/2එච්02265 බළලත් නිලධාරි II පුස්සලමංකඩ පීආර්එම්එම්බී සහභාගී විය. එහිදී දක්ෂතම විදේශීය සරඹ උපදේශකයා මෙන්ම හොඳම සරඹවලට හිමි සම්මානයන් හිමිකර ගැනීමට මොහු සමත් වී ඇත. තම උපන් මාතෘභූමියට මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදාවටද, ස්වේච්ඡා බළසේනාවටද, තම රෙජිමේන්තුවට මෙන්ම ඒකකයට ඉමහත් කීර්තියක් අත්කර දීමට සමත් වූ මෙම බළලත් නිලධාරි වෙත රණවිරුණ වෙතින් මෙසේ සුබපැතුම් එක්කර සිටින්නෙමු.



# රෙජිමේන්තු අධිපති ලෙස රාජකාරි භාර ගනිමින් ...





ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ 20 වන රෙජිමේන්තු අධිපති වශයෙන් මේජර් ජෙනරාල් එච් එල් වී එම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ජ්‍යෙෂ්ඨ නිලධාරී ජූලි මස 13 දින රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සිය රාජකාරී භාර ගන්නා ලදී. මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ඩබ්ලිව් එම් ඩී එස් කේ ගුණවර්ධන ආර්එස්පී කේඑස්පී විසින් රෙජිමේන්තු අධිපතිතුමන් පිළිගැනීමෙන් පසු යුද්ධ හමුදා සම්ප්‍රදායානුකූලව මුර පරීක්ෂාවක් පිරිනමන ලදී. මව්බිමේ ඒකීයභාවය වෙනුවෙන් දිවිපිදූ රෙජිමේන්තු සාමාජිකයින් සිහිකරමින් රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර පුදකිරීමෙන් අනතුරුව රාජකාරී භාරගැනීම සංකේතවත් කරනු වස් පැළයක් රෝපණය කරන ලදී. එතුමන් විසින් හටපිරිස් ඇමතීමෙන් පසුව රෙජිමේන්තු මධ්‍යස්ථාන ශ්‍රවණාගාරයේදී සියලු නිලධාරීන් ආමන්ත්‍රණය කරමින් ඉදිරි සැලසුම් පිළිබඳව සාකච්ඡා කිරීමටද මෙය අවස්ථාවක් කරගත් අතර එම අවස්ථාවට සෞඛ්‍යාරක්ෂිත පිළිවෙත් අනුගමනය කරමින් රෙජිමේන්තු මධ්‍යස්ථානයේ මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු මන්ත්‍රණ සභා සමාජිකයින්, ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, මාණ්ඩලික නිලධාරීන්, ඒකක අණදෙන නිලධාරීන් ඇතුළු සීමිත පිරිසක් සහභාගී වූහ.



# නික්මයන රෙජිමේන්තු අධිපතිට උපහාර ...

ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ රෙජිමේන්තු අධිපති ලෙස කටයුතු කරනු ලැබූ මේජර් ජෙනරාල් එන් ආර් ලමාහේවගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ජූලි මස 11 වන දින සිය ධූරයෙන් සමුගන්නා ලදී. ඒ වෙනුවෙන් කුරුණෑගල වැහැරවත්තෙහි පිහිටි රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී ඉතා සීමිත පිරිසකගේ සාහභාගීත්වයෙන් සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන් අනුගමනය කරමින් යුද්ධ හමුදා සාම්ප්‍රදානුකූලව සම්මාන පෙළපාලියක් පිරිනැමූහ. එම අවස්ථාව සඳහා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් ජ්‍යෙෂ්ඨ සහ කණිෂ්ඨ නිලධාරීන් මෙන්ම සෙසුනිලයින් සීමිත පිරිසක් සහභාගී වූහ. වසර 35 ක අනර්ඝ යුද හමුදා සේවා කාලයකින් පසු විශ්‍රාම දිවියට එළැඹි ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමනි, ඔබට සහ පවුලේ සියලුම සාමාජිකයන්ට නිදුක් නිරෝගී ජීවිතයකට සියලුම රෙජිමේන්තු සාමාජිකයන් වෙනුවෙන් සුබ ප්‍රාර්ථනා මෙසේ එක්කර සිටින්නෙමු.

## ඒකක තතු අභිමනින්

## 11 (සේවි) ශ්‍රීලංසිරෙ

# 27 වන සංවත්සරය ....





මඩකලපුව, කුරුක්කල්මඩම ප්‍රදේශයේ ස්ථාපිත 11 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට අප්‍රේල් මස 16 දිනට විසිහත් වසරක් සපිරේ. එම සංවත්සර සැමරුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන් අනුගමනය කරමින් චාම් අයුරින් වුවද අභිමානවත්ව සමරන ලදී. එයට සමගාමීව ඒකක මූලස්ථානය වෙත මහාසංඝරත්නය වැඩම කරවා මියගිය රණවිරුවන්ට පින් අනුමෝදන් කරමින් බෝධිපූජාමය පිංකමක් සිදුකරන ලදී. සංවත්සර දිනය වෙනුවෙන් ඒකක අණදෙන නිලධාරි මේජර් එම් ඩබ්ලිව් එම් උදය කුමාර ශ්‍රීලංසිරෙ වෙත කඳවුරු සම්මාන මුරයක් පිරිනැමු අතර, සංවත්සර දින සිහිවීම වස් අණදෙන නිලධාරි විසින් කඳවුරු භූමියේ අඹ පැළයක් රෝපණය කිරීමෙන් අනතුරුව සියලුනිල තේ පැන් සංග්‍රහයක්ද පවත්වමින් එහි නිමාව සනිටුහන් කරන ලදී.

## 2 (සේවි) විපාරෙ

# පාලන කටයුතු සොයා බලමින් ...



21 වන පාබල සේනාංකයේ වත්මන් සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව් ආර් එම් එම් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ජ්‍යෙෂ්ඨ නිලධාරි වව්නියාව ඉරට්ටපෙරියකුලම් හි ස්ථානගත 2 වන (සේවි) විජයබාහු පාබල රෙජිමේන්තුව වෙත මැයි මස 03 වන දින කඳවුරු නිරීක්ෂණ සංචාරයක නිරත විය. ඒකක අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් එස් එම් එස් බංඩාර ආර්එස්පී විපාරෙ විසින් එතුමන්ව පිළිගනු ලැබීය. එහිදී සේනාංකාධිපති විසින් ඒකකයේ වත්මන් තත්වය පිළිබඳව සොයා බැලූ අතර, ඒකක අණදෙන නිලධාරිහට උපදෙස් ලබාදීමෙන් පසු එම සංචාරය නිමා කරන ලදි.

## 4 (සේවා) ශ්‍රීලයුයුබ





# බැති සිතින් වන්දනා ...

4 (සේවා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බළකා කඳවුරු පරිශ්‍රය තුළ අභිනවයෙන් ඉදිකරමින් පවතින චෛත්‍ය රාජයාණන් වහන්සේගේ සර්වඥ ධාතූන් වහන්සේලා සහ නිධන් වස්තු තැන්පත් කිරීම වෙසක් පුන් පොහෝ දිනට සමගාමීව 2021 මැයි මස 22 වන දිනට යෙදී තිබූ සුබ මොහොතින් සිදුකරන ලදි.

කඳවුරු භූමියේ අභිනවයෙන් ඉදිකරනු ලබන චෛත්‍ය රාජයාණන් වහන්සේ ඉදිකිරීම ඒකකයේ සියලු නිලයින්ගේ දායකත්වයෙන් සිදුකරනු ලබයි. සර්වඥ ධාතූන් වහන්සේලා සහ නිධන් වස්තු තැන්පත් කිරීම ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් මහා සංඝරත්නයේ පූර්ණ අනුශාසනා සහ ආශිර්වාදය සමගින් ඒකක අණදෙන නිලධාරි ඇතුළු සියලු නිලයින්ගේ සහභාගීත්වයෙන් සිදුකළ අතර එම පුණ්‍ය කටයුත්ත ඒකක කැමරා කාචයේ මෙසේ සටහන් විය.

## 4 ශ්‍රීලංජාආබමු









# සෙබළ පහසුකම් වැඩි දියුණු වෙමින් ...

නොච්චියාගම, හැලඹවැව, ගාලදිවුල්වැව ප්‍රදේශයේ ස්ථානගත 4 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අඩුපාඩුවක්ව පැවති සෙසුනිල භෝජනාගාරය අභිනවයෙන් ඉදිකර මැයි මස 24 වන දින ඒකක අණදෙන නිලධාරි මේජර් එස් එම් පී බංඩාර ශ්‍රීලංජාආබමු ගේ සුරතින් සෙසු නිලයින්ගේ අයිතියට පත් කරන ලදී. එයට සමගාමීව වෙඩි ද්‍රව්‍ය ගබඩාව, සම්මාන මුර පීඨිකාව, ධජ ස්ථම්භකය සහ කඳවුර ඉදිරිපස වැට අභිනවයෙන් ඉදිකළ ඉදිකිරීම් වේ. අණදෙන නිලධාරිගේ මගපෙන්වීම යටතේ දෙවන අණදෙන නිලධාරිගේ අධීක්ෂණය මත සිදුකරනු ලබන නව ඉදිකිරීම් ඒකක සියලු නිලයින්ගේ ශ්‍රමදායකත්වය මත ප්‍රාදේශීයව සපයා ගන්නා ලද භෞතික සම්පත් යොදා ගනිමින් සිදුකිරීම විශේෂත්වයකි.



# නිර්මාණ අස්පුව ...

## මගේ ආදරේ විඳින්න ...

තනිවුණ හැම මොහොතෙම
ඔය හිතට පාළුව දැනෙයි.
ආයේ කවදාවත්ම
මගේ කටහඬ, මගේ හිනාව
ඔයාට ඇහෙන එකක් නෑ

ඔයාට විහිළු කරල
ඔය මුවට හිනා ගේන
වෙලාවකට වදයක් වෙලා
ඔයාව තරහ ගස්වන්න
කෙනෙක් සඳහටම නැතිවෙයි

ඒ හැමදේම කරලා
අන්තිමට සමාව ඉල්ලන කෙනෙක්
ඔයාට තව දුරටත් නැතිවෙයි.
ඔය ඇස්වලින් හුඟක් කඳුළු එයි
ඒත් මම ගිහින් තියෙයි හැමදාටම

ඔයාට ගොඩක් ආදරේ කළ
මා නැතැයි දුක දැනෙන්න එපා
කවදාවත්ම ඔය හිතට,
දවසක ඔයාට තේරෙයි
ඒ සෙනෙහෙ මහමෙරක් බව

ඔයාට තවමත් නොදැනෙන
මහදේ ජීවන සෙවනැල්ල නුඹ
මේ පපුවේ හුස්ම තියෙන කල්
මගෙ විහිළු වලට හිනැහී
මගේ ආදරේ විඳින්න.

බ්‍රිගේඩියර් එස් එන් සමරවික්‍රම කේඑස්පී
පුහුණු පරීක්ෂක ශ්‍රීලංයුහසෙව්බමු

## සඳාදර බිරිඳ ...

නිදහස් සියොත් සිතුවිලි සිරගත කරවා
පිම්මේ නඟන මුව පා එක්තැන් කරවා
දැල්වී ගිනි පුළිඟු හද සෝකෙන් පුරවා
රත්වී ගලන කඳුලැලි දෙකොපුල් තෙමුවා

ඔබ තනි පැලේ මා එනතුරු බලා මඟ
කිරිකැටි දරු පැටව් තුරුලේ බැඳී හද
අගහිඟකම් නොදී ඔබ ගිනි දරා කුස
අප මල් කැකුළු රැක ගත්තා වෙලා හඳ

ලේ කිරිකර පොවා දරුවන් දැඩි කෙරුව
රෑ නිදිවරා ඔවුනට රැකවල් යෙදුව
වෙහෙසද නොම සිතා උන් සුරතල් කෙරුව
ඔබ මුළු දිවිය අප වෙනුවෙන් කැප කෙරුව

බිරිඳයි සදාදර මව් සෙනෙහෙන් පෙම්මා
ගුණ දම් කියා යහමග හැමවිට පෙන්වා
පුරවා සිත් තුටින් මුව හසරැලි නන්වා
නිවසේ සිරිකතයි පෙම්බර සුදු අම්මා

ලා/කෝ ඉන්දික ජීවීපීපී
නිලධාරී ශාඛාව ශ්‍රීලංයුහසෙව්බමු

## බැහැරවාසී සෙබළ කුමරිය ...

හිරු කුමරු පායා එන්නට පෙර
කුරුලු නාදය ඇසෙන්නට පෙර
නිදිබර නෙතු අවදි කර
ලිප ගිනි මොළවන කුමරියේ

කිරි කැටි පුතුගෙ කුසගිනි නිවාලන
රස මසවුලු ගෙන යන්නට
සොඳුරු කැදැල්ලේ සුවය විඳින්නට
සිතැඟි පැතුම් දරා
කඳවුර වෙත පැමිණෙන කුමරියේ

කෑම සොයා යන කුහුඹු රැළක් සේ
දිව එන විට ඔබ හරිම අගේ
නිල ඇඳුමින් ගත සරසා
සිනා මුවින් මුව සරසා
මීමැස්සන් සේ වැඩ කරමින්
පරිඝණකය ළඟ ගැවසෙන කුමාරියේ

ගිනි අවියෙන් සිත් දරදඬු වූ දා
ප්‍රේමයෙ අවියත් සිතැඟි දරා
දරුවන් වැදු ඔබ ගැහැණියක වූ දා
කැදැල්ලේ බර හිසමත දරා
සෑමදාම ගෙදර දුවන මුවැත්තියේ
සෙබළියකි මව්බිමට රණගොස නංවනා

කෝප්‍රල් දිල්රුක්ෂි ගුණවර්ධන පී
ගිණුම් අංශය ශ්‍රීලංයුහසෙව්බමු



## 3 (සේවා) ශ්‍රීලයුකාබ

# වෙසගේ අසිරිය විදිමින් ...

මුලතිව්හි නන්දිකඩාල් ප්‍රදේශයේ ස්ථානගත 3 වන (සේවා) කාන්තා බළකා සෙබළියන්ගේ සාමුහිතක්වය මෙන්ම සමගිය විදහා පාමින් සියලු සාමාජිකයින් එක්ව මෙවර වෙසක් තෙමඟුල බැතිබර සිතින් සමරන ලදී. එහිදී පටාචාරා කතා පුවත ඇසුරින් නිමවා තිබූ පහන් කූඩුව කාගෙත් සිත් ගන්නා සුළු විය. එම අලංකාරවත් පහන් කූඩුවේ නිර්මාණ දායකත්වය සැරයන් ධර්මලතා ජේපී විසින් කළ අතර එය ඒකක කැමරා කාචයේ මෙසේ සටහන්ව තිබුණි.

## 13 ශ්‍රීලංජාආබමු

# සමාජ සත්කාර ...







මුලතිව්, මුතියන්කඩ්ඩුකුලම් ප්‍රදේශයේ ස්ථානගත 13 වන ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුව මඟින් පසුගිය සිංහල හා හින්දු අලුත් අවුරුද්ද නිමිත්තෙන් ඒකක බලප්‍රදේශයට අයත් ගම්මානයක් වන ජීවනගර් ගම්මානයේ තෝරා ගන්නා ලද දිළිඳු පවුල් සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය බෙදාදීමේ වැඩසටහනක් අප්‍රේල් මස 14 වන දින සිදුකරන ලදී. ඒකක අණදෙන නිලධාරි මේජර් ජී එස් එල් තුෂාර ශ්‍රීලංජාආබමු ගේ මගපෙන්වීම යටතේ ඒකක සියලු සාමාජිකයින්ගේ දායකත්වය තුළින් සිදුකරන ලද මෙම සත්ක්‍රියාව ජාතීන් අතර සංහිඳියාව ඇති කිරීමට මහත් පිටුවහලකි.

# අවැසි මොහොතේ අතහිත ...



## 5 (සේවා) ගරෙ

5 (සේවා) ගජබා රෙජිමේන්තුව විසින් පසුගිය සිංහල හා හින්දු අලුත් අවුරුද්ද නිමිති කොටගෙන ඒකක බලප්‍රදේශය තුළ වැඩසටහන් රැසැක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අතුරින් හොරොව්පතාන ප්‍රදේශයේ ජීවත්වන අඩු ආදායම්ලාභි පවුල් 250 ක් සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය බෙදාදීමේ වැඩසටහනක් අප්‍රේල් මස 12 වන දින වන්නි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩී එම් එච් ඩී බණ්ඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. මේ සඳහා සන්ෂයින් කන්සියුමර් ලංකා ලිමටඩ් ආයතනයේ දර්ශන ඉලංගසිංහ, දුමින්ද සිරිවර්ධන සහ සමීර උක්ගල්ල යන මහත්වරුන්ගේ අනුග්‍රාහක දායකත්වය ලැබුණි.

## 20 (සේවා) විපාරෙ





# සමාජ සත්කාර ...



20 (සේවා) විජයබාහු පාබල රෙජිමේන්තුව විසින් කොවිඩ් වසංගතය මැඩලීම සඳහා වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව ඒකක බලප්‍රදේශය තුළ ස්වයං නිරෝධායනය වන පවුල් සඳහා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදාදීම, ආනවිලන්දාන්කුලම් හා ස්කන්ධපුරම් ප්‍රදේශයේ පොදු ස්ථාන විෂබීජහරණය කිරීම සහ ආනවිලන්දාන්කුලම් හි ඒකක දායකත්වයෙන් නිරෝධායන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සිදුකරනු ලබයි.

එම ක්‍රියාවන්ට අමතරව ඒකක අණදෙන නිලධාරි මේජර් එස් ජේ ජී ඒ එම් සුභසිංහ ආර්එස්පී ගේ මඟපෙන්වීම යටතේ වෙසක් පුන් පොහෝ දිනය නිමිත්තෙන්ද, ඒකක බලප්‍රදේශයේ ග්‍රාම සේවා වසම් 8 ක් ආවරණය වන පරිදි අඩු ආදායම්ලාභී පවුල් සඳහා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදාදීමක්ද, ආනවිලන්දාන්කුලම් සිවිල් වැසියන්ගේ අවශ්‍යතාව සඳහා පොදු ව්‍යාපාර ගොඩනැගිල්ලක් ඉදිකිරීමටද ඒකක සාමාජිකයන් විසින් කටයුතු කරන ලදී.

ඒකක බලප්‍රදේශයේ ජීවත්වන සිවිල් ජනතාවගේ ජීවන තත්වයන් ඉහළ නැංවීම උදෙසා විවිධ වූ සත්කාරක වැඩසටහන් සිදුකරන ලද අතර, තම ඒකකය නගාසිටුවීම වෙනුවෙන්ද අභිනවයෙන් ඉදිකරන ලද රෙසැමේ නේවාසිකාගාරය අණදෙන නිලධාරීගේ ආරාධනයෙන් 662 බසේමු බලසේනාධිපති කර්නල් එච් එල් සී ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ සුරතින් විවෘත කරන ලදී.







සටහන :-

කෞමදි කරුණාගොඩ මිය.
B.A.M.S (Hons) Sri Lanka, MS (Gyn & Obs) India
විශේෂඥ වෛද්‍ය ප්‍රසව හා නාරිවේද (ආයුර්වේද)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
දේශිය වෛද්‍ය විද්‍යාතනය
කොළඹ විශ්වවිද්‍යාලය.

# දේශීය කුළුබඩුවල ඖෂධීය ගුණ

ශ්‍රී ලංකාව අපට හුරුපුරුදු එදිනෙදා ආහාර රටාවෙහිදී කුළුබඩු භාවිත කිරීම පිළිබඳ ඉහළින්ම කතාබහට ලක්වන රටකි. ඈත අතීතයේ පටන්ම අපගේ මුතුන් මිත්තෝ ආහාර පිළියෙල කිරීමට විවිධාකාර කළුබඩු උපයෝගී කර ගත්තහ. මෑතකදී අප රටෙහි ප්‍රවීණ සුපවේදියෙකු ලෙස නම් දරා සිටින පබ්ලිස් සිල්වා මහතාගේ සොයා ගැනීම්වලට අනුකලව ඖෂධීය ගුණයෙන් යුතු කුළුබඩු නැතිනම් ආහාර රසගන්වනයන් වර්ග 40 කට ආසන්න ගණනක් ඇති බව පෙනේ. ශ්‍රී ලාංකිකයන් දියුණු තාක්ෂණික මෙවලම් නොතිබූ කාලයක පවා වැව් අමුණු දාගැබ් ගොඩනැගුවේ මෙම විස්තෘත වූ ඖෂධීය ගුණැති කුළුබඩු එදිනෙදා ආහාරයට යොදා ගැනීමෙන් ලැබූ ශක්තිය නිරෝගීබව හා ජවය උපයෝගි කරගෙන බැව් සමහර සමාජ විද්‍යාඥයෝ මත පළකරති. මෙම කුළුබඩු භාවිතයේ ප්‍රචලිතභාවය නිසාම ශ්‍රී ලංකාව **කුළුබඩු උයන** ලෙසින්ද විදෙස් සංචාරකයන්ගේ ආකර්ෂණයට ලක්ව පවතී. අප රටෙහි සංචාරක කර්මාන්තයට අදාළ Spice සංකල්පය බිහිවී ඇත්තේද මේ හේතුවෙනි.

මෙතරම් ප්‍රචලිත අපගේ අනන්‍යතාව සනිටුහන් වන්නාවූ දේශීය ආහාරයේ රස ඔප්නංවන කුළුබඩුවල දක්නට ලැබෙන බොහෝ දෙනා නොදන්නා ඖෂධීය ගුණයන් පිළිබඳ හැඳින්වීමක් ලබා තිබීම අප කාටත් වැදගත්ය.

## කරපිංචා



මෙය ආහාර රසය ඇතිකරවන සුළු සුවදකින් යුතු පත්‍ර විශේෂයකි. මධ්‍යම ප්‍රමාණයේ ගසක් ලෙස වර්ධනය වන කරපිංචා ශාකය ලංකාවේ සෑම පලාතකම පාහේ වැවෙන ශ්‍රී ලංකාවට හා ඉන්දියාවට ආවේණික ශාකයකි, එහි පත්‍ර ව්‍යංජන රසවත් කිරීමට යොදා ගනි. ඒ නිසාම Curry Leaves යන නමින් ඉංග්‍රීසියෙන් හඳුන්වනු ලබයි. ආහාර අජීරණය පවතින අයට කෑමෙහි ප්‍රියතාව ඇතිකිරීමට කරපිංචා භාවිතා කරන අතර කොලෙස්ට්රෝල් තැන්පත්වීම පාලනයට මෙන්ම දියවැඩියාවට ගුණදායකය. විෂ ශරීරගත වූවන්ට කරපිංචා කැඳ දීම අතීතයේ සිට ජනප්‍රිය සුදුලූණු, රතුලූණු, ගම්මිරිස් එක්කර අඹරාගනු ලබන කරපිංචා සම්බෝලය ආහාරයේ රසය ඉස්මතු කරනවා සේම ආහාර දිරවීමටද උදව් කරයි. මෙහි ඇති ඖෂධීය ගුණය නිසාම කරපිංචා එක්කර බිස්කට්, කොකිස්, පපඩම්, මුරුක්කු ආදිය පිසීම අප රටේ සුලබය.

## කරාඹුනැටි





කරාඹුනැටි හෙවත් **Clove** ඉන්දුනිසියාවේ සිට ලොව පුරා ප්‍රචලිත වූ කුළුබඩුවකි. මෙම මධ්‍යම ප්‍රමාණ ගසෙහි හටගන්නා මල් පිපීමට පෙර කැකුළු අවදියේදී කඩා වියළා කරාඹුනැටි ලෙස භාවිතයට ගනී. බොහෝවිට වියළි කරාඹුනැටි එලෙසම යොදන අතර කුඩු වශයෙන් යෙදා ගන්නා අවස්ථාද වේ. එහි ඇති සුවිශේෂී සුවඳ නිසා බත් වර්ග, මස් ,මාළු, පොළොස් වැනි ව්‍යංජන සේම දෝසි වර්ග, රසකැවිලි, අතුරුපස පිළියෙල කිරීමේදීද යොදා ගනි. කරඹුනැටි මුඛයේ විවිධ රෝග, දන්තාබාධ සඳහා යොදාගනු ලබන ඖෂධයකි. කරඹුනැටි හැපීම හෝ කරඹුනැටි තෙල් පෙඟවූ පුළුන් කැබැල්ලක් තැබීම දත් වේදනා දුරු කිරීමට ඉවහල් වේ.

## කුරුඳු



රසය මෙන්ම සුවඳවත්බව ඇතිකිරීමට කුරුඳු කඳෙහි පොත්ත වියළා භාවිතයට ගනී. දියවැඩියා රෝගයෙන් පෙළෙන පුද්ගලයින්ට පිළිකා හඳුනාගත් අයට මෙය ඉතා ගුණදායකය. ආහාරයට එක් කරගන්නා සේම කුරුඳු පොත්තක් සතියකට කිහිප දිනක් කහට තේ වලට හෝ කුඩු තේ හැඳි භාගයක් පමණ එක්කිරීම සුදුසු වේ. කුරුඳු ව්‍යංජනයට සේම රසකැවිලි පිළියෙල කිරීමේදීද යොදාගනී.

## කහ



වෙළඳපොලේ පැවති හිඟය නිසා පසුගිය දිනවල බෙහෙවින් කතාබහට ලක්වූ කහ, පඳුරු ලෙස වැඩෙන ශාකයේ පොළොව තුළ හටගත් කඳ හෝ අලයයි. මෙම අල සෝදා තම්බා වියළා කුඩුකර හෝ ව්‍යංජන හා වෙනත් ආහාර පිළියෙල කිරීමේදී යොදයි. ලංකාවේ භාවිතා නොකළද ඉන්දියාව වැනි රටවල්වල කහ අමුවෙන් පෙති ගසා අච්චාරු, සලාද ලෙසද ආහාරයට ගනු ලබයි. කහ විෂබීජ නාශකයක්ද වන අතර අසාත්මිකතා සඳහාද ගුණ දෙනු ලබයි. බෝවන රෝගවලින් ආරක්ෂාවීම සඳහාද යොදා ගනී.

## සූදුරු



සූදුරු, මහදුරු, දුරු, අසමෝදගම් වැනි දුරු කුලයට අයත් ඖෂධීය කුළුබඩුවක් වන සූදුරු අප එදිනෙදා භාවිතා කරන තුනපහවල ප්‍රධාන අංගයකි, මේරු පත්‍ර නෙළා වියළා ගන්නා කුඩු සූදුරු කුඩු ලෙස හෝ එලෙසින්ම ආහාර රසගැන්වීම සදහා යොදා ගනී. ආහාර දිරවීම පහසු කරන ගුණයක් එහි ඇත. අජීර්ණ තත්වයකදී හෝ වමනය සහිත විට සූදුරු කබලේ බැද තම්බා වතුර පානයට දෙයි.

## උළුහාල්



හැපීමේදී තිත්ත ගතියක් ඇතත් ව්‍යංජන සුවඳවත් කිරීමටත් උකු කිරීමටත් හැකියාව ඇති හෙයින් උළුහාල් අප මුළුතැන්ගෙට නැතිවම බැරි කුළුබඩුවකි. පඳුරු සහිත ශාකයක හටගන්නා බීජයන් වන උළුහාල් වියළා කුළුබඩු ලෙස වෙළඳපොලට නිකුත් වේ. මේ බීජ රත්කල තැටියක දමා ගින්නෙහි රස්නයෙන් බැදගැනීමෙන් සුවඳ විහිදුවන උළුහාල් ලබාගනි. උළුහාල් රුධිරගත කොලෙස්ටරෝල් මට්ටම පවත්වා ගැනීමට ඉතා හොඳ ඖෂධයකි. කුඩු මී පැණියෙන් හෝ බීජ තේ හැන්දක් පමණ රාත්‍රියට ඇල්වතුර වීදුරුවකට බහා තබා පසුදින උදෑසන හිස්බඩ පානය කිරීම කොලෙස්ටරෝල් මට්ටම පාලනයට හොඳ අත්බෙහෙතකි.

## ඉඟුරු



කහ මෙන්ම පත්‍ර හටගන්නා පස යට පවතින කඳ හෙවත් අල ඉඟුරු ලෙස භාවිතා වේ. අයුර්වේදයට අනුව අමු ඉඟුරු හා වියළි ඉඟුරුවල ගුණයන් එකින් එකට විශේෂිතය. කැස්ස සෙම්ප්‍රතිශ්‍යාව වැනි සෙම රෝගවලදීද අජීර්ණය වමනය මල බුරුලට යාම වැනි ආහාර නොදිරවීමේ රෝගවලදීද ඉඟුරු ඉතා වටිනා ඖෂධයකි. අමු ඉඟුරු කොල මිරිකා ගත් යුෂ මීපැණි සුකිරි දමා සෙම රෝගවලදී භාවිතා කරයි.

මෙලෙස ශ්‍රී ලාංකේය දේශීය ආහාර රටාවේ අඩංගු තුනපහ ඇතුළු කුළුබඩු විශේෂයන් මගින් නිරෝගී ජනසමාජයක් පවත්වාගෙන යාම සඳහා ලබාදෙන රුකුල අතිමහත්ය. මේ කුළුබඩුවල ඖෂධීය ගුණය ලැබීමට නම් එය ඖෂධ ලෙස වෙන් වෙන්ව භාවිතය නොව ආහාරයට එකතු කිරීම වඩා ගුණදායී හා ආරක්ෂිත බැව් මෙහිදී සඳහන් කල යුතුය.

## 5 (සෙව්) ගරෙ

### ඒකක තතු අභිමනින් ...



## කඳවුරු සංචාරයක නිරතවෙමින් ...

623 පාබල බලසේනා මූලස්ථානයේ නව බලසේනාධිපති කර්නල් එම් ජේ ආර් එස් මැදගොඩ ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී හොරොව්පතාන ප්‍රදේශයේ ස්ථානගත 5 (සෙව්) ගජබා රෙජිමේන්තුවේ ජූනි මස 01 වන දින කඳවුරු නිරීක්ෂණ සංචාරයක නිරතවිය. එහිදී ඒකක අණදෙන නිලධාරි මේජර් කේ කේ ජයසිංහ ගරෙ විසින් යුද හමුදා සම්ප්‍රදායානුකූලව එතුමන්ව පිළිගනු ලැබූ අතර, ඒකකයේ පවතින පාලන හා රාජකාරි ගැටළු පිළිබඳව මෙහිදී සොයා බලන ලදී.

## 3 (සෙව්) ශ්‍රීලංසිරෙ

### කැපවීමෙන් ජයග්‍රහණය කරා ...





වසන්ත සැණකෙළියට සමගාමීව මධ්‍යම පලාතම ආවරණය වන පරිදි වාර්ෂිකව සංවිධානය කරනු ලබන "**APRIL BLOOMS - 2021**" අලංකාරවත් මල් සැකසුම් හා උද්‍යාන තේරීමේ තරඟාවලියේදී කඳවුරු භූමියේ පිහිටි මල් වැට වෙනුවෙන් ප්‍රථම ස්ථානයද, උද්‍යානය හා තෘණ භූමිය සඳහා දෙවන ස්ථානයද ජයග්‍රහණය කිරීමට නුවරඑළිය ප්‍රදේශයේ ස්ථානගත 3 (සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට හැකිවිය. ශ්‍රී ලංකා යුද්ධ හමුදා නාමයට කීර්තියක් එක්කල මෙම ජයග්‍රහණය ඒකක අණදෙන නිලධාරි ඇතුලු ඒකක සමාජිකයන්ගේ කැපවීමෙහි ප්‍රතිඵලයකි. එහි කුසලාන/සහතික පත්‍ර හා මුදල් ත්‍යාග පිරිනැමීම අගමැති ආර්යා ගරු ශිරන්ති රාජපක්ෂ මැතිණියගේ ප්‍රධානත්වයෙන් අප්‍රේල් මස 18 වන දින නුවරඑළිය වික්ටෝරියා උද්‍යානයේදී උත්කර්ෂවත් අන්දමින් සිදුවිය.

## 2 (සෙව්) විපාරෙ





# ප්‍රජා සත්කාරක වැඩසටහනක් ...

2 වන (සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තු අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් එස් එම් එස් බංඩාර ආර්එස්පී විපාරෙ ගේ මගපෙන්වීම මත ඒකක සාමාජිකයන් විසින් සංවිධානය කළ ඒකක බලප්‍රදේශයට අයත් ඇතාකඩ සහ හිරල්ලුගම යන ග්‍රාම නිලධාරි වසම්වල පදිංචි අඩු ආදායම්ලාභී පවුල් 500 ක් වෙත පසුගිය සිංහල හා හින්දු අලුත් අවුරුද්ද නිමිති කොටගෙන අත්‍යවශ්‍ය ද්‍රව්‍ය බෙදාදීමක් අප්‍රේල් මස 11 වන දින ඇතාකඩ හිරල්ලුගම පාසල් භූමියේදී සිදුකරන ලදි. මෙම චාම් උත්සවය 211 බලසේනා මූලස්ථානයේ බලසේනාධිපති බ්‍රිගේඩියර් එම් සී එස් කේ සේනාරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේදයන්ට අනුකූලව පැවති අතර මේ සඳහා 211 බලසේනා මූලස්ථාන සිවිල් සම්බන්ධීකරණ නිලධාරි, ඒකක අණදෙන නිලධාරි ඇතුළු පිරිසක් සහභාගී වූහ.

## 3 (සෙව්) ගැහේබ

# පවිත්‍ර වූ වෙරළක් උදෙසා ...

ශ්‍රී ලංකා මුහුදු සීමාව තුළදී කොළඹ වරායට ආසන්නයේදී භාණ්ඩ ප්‍රවාහන නෞකාවක් ගිනි ගෙන විනාශයට පත්වීම හේතුවෙන් ශ්‍රී ලංකා වෙරළ තීරයට පාරිසරිකව බලපෑමක් එල්ල විය. එම පිපිරීම හේතුවෙන් අහිතකර රසායනික ද්‍රව්‍ය නිසා අපවිත්‍ර වූ මිදිගම සහ වැලිගම මුහුදු තීරයන් පිරිසිදු කිරීමේ පරිසර හිතකාමී සත්කාරයක් ජුනි මස 01, 02 සහ 03 යන දිනයන්හිදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවට අයත් 3 (සෙව්) ගැහේබ ඒකකයේ අණදෙන නිලධාරිගේ උපදෙස් අනුව ඒකක භටපිරිස් විසින් අපදා කළමණාකරණ මධ්‍යස්ථානය හා එක්ව සිදු කරන ලදී.






**පසුගිය කලාපයෙන් මධ්‍යම උස්බිම් අතරින් එකක් වන " සමනළ කන්ද " දෙසට යොමු වූ " මාලිමාව " මෙවර යොමු වනුයේ ශ්‍රී ලංකාවේ මධ්‍යම උස්බිමක් වන**

# හොර්ටන් තැන්න වෙතටය.

ශ්‍රී ලංකාවේ මධ්‍යම උස්බිම් පිළිබඳ මෙහිදී සඳහන් කළයුතු සුවිශේෂී කාරණය වන්නේ ශ්‍රී ලංකාවේ මධ්‍යම උස්බිම් වන සමනළ කන්ද, හෝර්ටන් තැන්න ජාතික උද්‍යානය හා නකල්ස් රක්ෂිතය 2010 ජුලි 31 වන දින බ්‍රසීලයේදී පැවැත්වූ 34 වන ලෝක උරුම සමුළුව මගින් නවතම ලෝක උරුමයන් ලෙස නම් කිරීමයි.

මෙම වැසි වනාන්තර මුහුදු මට්ටමේ සිට මීටර් 2,500 (අඩි 8,200) දක්වා විහිදෙන අතර ශ්‍රී ලංකාවට ආවේණික සපුෂ්පික ශාකවලින් අඩක් සහ ආවේණික පෘෂ්ඨවංශිකයන් ගෙන් 51 % ක් මෙම පරිසර කලාපයට අයත් වේ. ආවේණික ක්ෂීරපායි විශේෂ පහක් සහ ආසන්න ආවේණික විශේෂ අටක් වාසභූමි කොටගත් මෙම පරිසර කලාපයේ අතිශය ආවේණික පක්ෂි විශේෂ පහක් සහ ආසන්න ආවේණික විශේෂ 20ක් වාසය කරයි. මෙම ප්‍රදේශය වලස් වඳුරා (කළු වඳුරු උපවිශේෂයක්) සහ හෝර්ටන් තැන්න උනහපුලුවා (රත් උනහපුලු උපවිශේෂයක්) ඇතුළු විවිධ ක්ෂීරපායි ජීවී විශේෂ කිහිපයකටම රැකවරණය සලසයි.

## හෝර්ටන් තැන්න

මහඑළිය හෙවත් හෝර්ටන් තැන්න යනු දෙස් විදෙස් කාගෙත් නෙත් සිත් ආකර්ෂණය කළ ශ්‍රී ලංකාවේ පිහිටි අති සුන්දර භූමියකි. ඉමක් දැකිය නොහැකි ගෝලීය වස්තුවක් වූ මෙය ජෛව විවිධත්වයෙන් මෙන්ම පුරාවිද්‍යාත්මක වටිනාකම අතින් ද ඉතා විශේෂ අසිරිමත් වූ ජාතික වනෝද්‍යානයකි. ලෝකාන්තය සොයා යන කෙනෙකුට අප රටේ වෙනත් කිසිම පරිසර පද්ධතියක හමුනොවන අපූර්වතම හුදෙකලාවකින් යුත් සුන්දර තැනිතලාවක් හමු වෙයි. මෙම අති සුන්දර ජෛව විවිධත්වයෙන් යුතු වූ සීතල නුවරඑළියේ පිහිටි වනෝද්‍යානය අන් කිසිවක් නොව හෝර්ටන් තැන්නයි.

## පිහිටීම

ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ පිහිටි එකම ජාතික වනෝද්‍යානය වන හෝර්ටන් තැන්න මහඑළිය නමින් මුලින්ම හඳුන්වා ඇති අතර මෙය ලංකාවේ පිහිටි උසම තැනිතලා භූමියයි. එසේම විද්වත් මත පිළිබඳ විමසීමේදී එල්.සී කුක් (1930) නිරක්ෂීය වනාන්තර හා පහත් තණබිම් කාණ්ඩයට ද, චැම්පියන් (1936) කඳුකර වනාන්තර ලෙසට ද, චැප්ටන් (1947) නිවර්තන සදාහරිත වනාන්තර ලෙසටද මෙය හඳුන්වා ඇත.

## පුරාවිද්‍යාත්මක වටිනාකම

1920 දශකයේ ඉංග්‍රීසි ජාතික කපිතාන් විලියම් පිෂර්, කර්නල් ඇල්බට් වොට්සන් යන දෙදෙනා විසින් මුලින්ම හෝර්ටන් තැන්න සොයා



ගෙන ඇත. එහෙත් මෙයට හෝර්ටන් තැන්න යන නාමය ලැබී ඇත්තේ ශ්‍රීමත් හෝර්ටන් ආණ්ඩුකාරවරයාගේ සංචාරයෙන් පසුවයි. 1969 දී මෙම වනාන්තරය ස්වභාවික වනාන්තරයක් ලෙස නම් කරන ලදි. හෝර්ටන් තැන්න පිළිබඳව කරන ලද පුරාවිද්‍යාත්මක පර්යේෂණ දෙස අවධානය යොමු කළහොත් 1992 අරඹන ලද පර්යේෂණවලදී හෝර්ටන් තැන්නේ අතීත පාරිසරික තත්වය, දේශගුණික තත්වය හා පැළෑටිවල ඉතිහාසය කෙරෙහි අවධානය යොමුකර තිබුණි.



කැළණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, ස්වීඩනයේ ස්ටොක්හොම් විශ්වවිද්‍යාලයේ චතුර්තක භූගර්භ විද්‍යා ආයතනය හා උත්සලා විශ්වවිද්‍යාලයේ විද්වතුන් එකතුව මෙම පර්යේෂණය සිදුකරන ලදි.

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ප්‍රේමතිලක මහතා සඳහන් කර ඇති ආකාරයට මෙහිදී සොයා බලන ලද්දේ ලෝකයේ අයිස් යුගයේ අවසානම එනම් ප්ලයිස්ටොසීන යුගයේදී ලංකාවේ පැවති පාරිසරික තත්වය පිළිබඳවයි. මෙහිදී අනාවරණය කරගත් තොරතුරු අතර,

- වසර 20,000 කට පමණ පෙර ලංකාවේ කඳුකර වැසි වනාන්තරවල ස්වභාවය.
- මීවන ශාකවල තත්වය.
- මිනිසා ඇසුරේ වැඩුණු ශාක.

ක්‍රි.පූ. 8000 තරම් ඈත යුගයේ වගා කටයුතු ආදිය පිළිබඳව ලත් තොරතුරු ලක් ඉතිහාසයට වැදගත්ය. මෙහි දක්නට ලැබෙන යෝධ මීවන හා මහරත්මල ඉතා ඈත අතීතයේ සිටම පැවති ඒවාය. එමෙන්ම මීට වසර 9000 කට පමණ පෙර පරිසර උෂ්ණත්වය ඉහළ යාම නිසා වර්ෂාපතනය අධික වී විවිධ ස්ථානවල ඇති වූ ජලාශ හෝර්ටන් තැන්නේ ද ඇති වූ බව සොයා ගැනුණි. මෙහි මධ්‍යශිලා යුගයේ (Mesolithc Man) මානවයා වාසය කළ බවත් ඔවුන් කෘෂිකාර්මික යුගයට පරිවර්තනය වූ බවත් මේ ආශ්‍රිතව කෙරුණ පර්යේෂණවලින් සොයා ගෙන ඇත. එසේම හෝටන් තැන්න ඓතිහාසික වශයෙන් ද ඉතා වැදගත් වූවකි.



## ජෛව විවිධත්වය

1992 දී සිදුකරන ලද පර්යේෂණවලට අනුව මෙහි ශාක විශේෂ 101 ක් පමණ ඇත. ඉන් 49 ක්ම ශ්‍රී ලංකාවට පමණක් ආවේණික වන අතර බහුතරයක් හෝර්ටන් තැන්නට පමණක් ආවේණිකය. ඇතැමුන් මෙහි පොදු ශාකය ලෙස වල් කුරුඳු (Innamounonalifolium) හඳුන්වන අතර ඇතැමුන් දඹ (Syzygium Ravolutum) යැයි පවසති. හෝර්ටන් තැන්නේ ශාක ඝණත්වය එනම් හෙක්ටයාර එකක ඇති ශාක සංඛ්‍යාව 2,861 කි. මෙහි පක්ෂීන් විශේෂ 98 ක් ද ක්ෂීරපායින් විශේෂ 14 ක්, උභය ජීවීන් විශේෂ 16 - 20 ක් පමණ ද, සමනල විශේෂ 40 ක් ද දැනට හඳුනාගෙන ඇත.







තොරතුරු අන්තර්ජාලය ඇසුරෙනි ..

# නිවසකට සුදුසු ඉඩමක් තෝරා ගැනීමේ නිවැරදි ක්‍රමය

## නිවසකට සුදුසු ඉඩමක හැඩය තෝරා ගන්න


පසුගිය කළාපය හා බැඳේ ..

**27. ෂඩාශ්‍රාකාර ඉඩම**




සුභඵල ගෙනදෙයි. පැති හයක් සහිත ඉඩමකි.

**28. කුඨඅෂ්ඨාකාර ඉඩම**



පදිංචියට අසුභයි. තුඹස් සහිත ඉඩමකි. කේතුවක හැඩය ගනි.

**29. සාධාරණ ඉඩම**




අධ්‍යාපනය, ප්‍රසිද්ධිය ලැබෙයි.
(දකින විට සිත් සතුටු කරන තැනිතලා බිමකි.)

**30. වරහාකාර ඉඩම**



වාසයට සුදුසු මෙම ඉඩම නැගෙනහිර පැත්තට මිටි ස්වරූපයකි.

**31. කේවාලාකාර ඉඩම**




ශ්‍රස්ත්‍රික නොවේ.
එහෙත් ප්‍රතිපල මධ්‍යස්ථයි. (බිත්තරයක හැඩය ගනි)

**32. පරිනායක්කාර ඉඩම**



ගිනි බිය, රජ බිය ඇති කරයි.
වටකුරු හැඩැති ඉඩමකි. දුටුව සැණින් බිය ගන්වයි.

**33. රාක්ෂමුඛ ඉඩම**



වාසයට සුදුසු නොවේ. නැගෙනහිරට බෑවුම ඇති ඉඩමේ වටේට කුඩා කඳුගැට වලින් යුක්තය.

**34. කුම්භාකාර ඉඩම**




රෝග ඇතිවේ. කළගෙඩිය හැඩය ගනි.

**35. ඡත්‍රාකාර ඉඩම**




ජයග්‍රහණය, වාසනා ගෙනදේ
(කොඩියක හැඩය ඇති ඉඩමකි)

**36. ගංගාකාර ඉඩම**



කෙටිකාලීන ප්‍රතිඵල සහිතය
පසුකාලීන ප්‍රතිඵල රහිත වේ.

**37. වෘෂභාකාර ඉඩම**



මෙම ඉඩම වාසනාව ගෙනදේ ගවයාගේ හැඩයට පිහිටා ඇති ඉඩමකි.

**38. ගජාකාර ඉඩම**



සැප සම්පත් ලැබෙයි. (ඇතෙකුගේ හැඩය ගනී.)

**39. සිංහාකාර ඉඩම**



සතුරු උවදුරු වලට ලක්වේ. සිංහයෙකුගේ හැඩය ගනි.

**40. කූර්වාකාර ඉඩම**



පදිංචිවූ විගස සුභයි. පසුව ප්‍රතීඵල අඩුවේ.
(මැද කොටස සමතලා උස්වී වටේට සැම දිශාවටම බෑවුම් ඇති ඉඩමකි.

**41. ධනවා භූමිය**




අසාර්ථක ජීවිතයක් ගත කිරීමට නිවැසියන්ට සිදුවේ. දුන්නක හැඩය ගත් භූමියකි.

**42. චතුර් කෝණ භූමිය**



ශුභඵල දායකවන නමුදු වාස්තු මාස රත්නය පරම්පරාගතව රැඳී සිටීමට සුදුසු නොවේ. (සතරැස්වූ මෙම භූමි භාගය මධ්‍යයෙන් උසට සිව්දෙසට බෑවුම්ව ඇත.

**43. ශිබාකාර භූමිය**



ජය භූමියක් වන මෙය නිවසක් තනා ගැනීමට සුදුසු භූමි භාගයකි. (වටේ ප්‍රදේශය උස්ව මැද බේසමක් හැඩය ගන්නා භූමියකි.)



**කපිතන් චාමර පෙරේරා 10 ශ්‍රීලංජාආබමු**
**ගෘහ සැලසුම් ශිල්පි**
**වාස්තු උපදේශක**
**(කැළණිය විශ්වවිද්‍යාලය)**



# අපේ හෙළබස නිවැරදිව හසුරුවමු.

ඕනෑම රටක සංස්කෘතියෙහි අනන්‍ය මෙන්ම වැදගත්ම ලක්ෂණය වනුයේ ස්වකීය භාෂාවයි. සිංහලය මව්බස වූ අපට ඒ සොඳුරු දායාදය පිළිබඳව අභිමානයෙන් යුතුව කතා කළ හැක. මානවයා විසින් සිය අදහස් උදහස් ඕනෑ එපාකම්, සිතැඟි අන් අය වෙත ප්‍රකාශ කිරීම සඳහා භාෂාව නිර්මාණය කරගෙන ඇත. ඒ නිසාම භාෂාව සන්නිවේදන උපකරණයකි. හෙළබස යනු බෙහෙවින්ම සුමට වූ සන්නිවේදන උපකරණයක් ලෙස හැඳින්විය හැකි තරමටම ගැමියා එය මනාව යොදා ගත්තේය. ගැමි ගෙදර සිට තුවායක් කරේ දමාගෙන බාල්දියකද අතැතිව පොදු නාන පොකුණ වෙත යන ගැමියා දෙස බලා අසල්වැසියා “ලොකු උන්නැහේ නාන්න යනවාදැයි” සිනාමුසු මුහුණින් යුතු ළෙන්ගතුකමකින් විමසනුයේ යන කාරණාව සක්සුදක් සේ දැනගෙනයි. බිඳකුදු ව්‍යාජත්වයකින් තොරවයි. එසේ විමසනුයේ අන්‍යෝන්‍ය සුහදතාව උදෙසාමය. එමගින් පැහැදිළි වනුයේ හෙළබස මව්බස කොටගත් ගැමියාගේ නිර්ව්‍යාජ සන්නිවේදනයයි.

මෙවන් වූ හෙළබසෙහි අර්ථාන්විත භාවිතාව පිළිබඳව විමසීමේදී මූර්ධජ ළ හා දන්තජ ල අකුරු නිවැරදි ලෙස භාවිත නොවූ විට අර්ථය ව්‍යාකූලවීමේ ගැටළුවට අපට මුහුණ දීමට සිදුවේ. එනිසා ඒ සම්බන්ධ ව්‍යාකරණ රීතීන් පිළිබඳව විමසා බැලීමට මෙහිදී අවධානය යොමු වේ.

එනම් හෙළබසෙහි මාතෘ භාෂාවන් වන පාලි සංස්කෘත භාෂාවන්වල හා ඇතැම්විට ඉංග්‍රීසි භාෂාවේ ල ශබ්දය සිංහලට බිඳීයාමේදී දන්තජ ල වශයෙන්ම යෙදෙන බව පහත උදාහරණ මගින් පැහැදිළි වේ.

- විද්‍යාලය
- රථය
- සිංහල
- මංගල
- කලාපය

සිදත් සඟරා කතුවරයාට අනුව **“වහරනු සෙරෙන් සපයා”** යන්නට අනුව ව්‍යාහරය ඇසුරින් ගත්විට ඉහත වචන මූර්ධජ ළ යොදා විද්‍යාළය, රථය, සිංහළ, මංගළ, කළාපය ලෙස භාවිත කිරීම දෝෂ සහිත බව කිව යුතුය.

මාතෘ භාෂාවල ට, ඨ, ඩ, ඪ යන අක්ෂර සිංහල භාෂාවෙහි යෙදෙනුයේ මූර්ධජ ළ වශයෙනි

- ඛේට - කෙළ
- පටිමා - පිළිම
- ක්‍රීඩා - කෙළි
- නාටක - නළු

සමානරූපී පදවල මූර්ධජ ළ හා දන්තජ ල ලෙස යෙදී අර්ථය වෙනස්වේ.

| | | | |
|---|---|---|---|
| දළ | - දළු | දල | - පත්‍ර |
| තුළ | - ඇතුළත | තුල | - සමාන |
| පිළි | - රෙදි | පිලි | - පිල්ලම් |
| පැළ | - පැළෑටි | පැල | - කුඩා ගෙය |
| මුළු | - සියලු | මුලු | - කොන් |

පාලි සංස්කෘත භාෂාවල පත්‍ර/පටි යන උප සර්ග සිංහලට බිඳියෑමේදී පිළි බවට පත්වේ.

- ප්‍රතිපත්ති - පිළිවෙත්
- පටිපාටි - පිළිවෙළ
- ප්‍රතිඋත්තර - පිළිතුරු
- පටිසරණ - පිළිසරණ
- ප්‍රතිබද්ධ - පිළිබඳ

මෙලෙස සිංහල භාෂාවේ මූර්ධජ ළ හා දන්තජ ල භාවිතය පිළිබඳ රීතීන් පවතින අතර ඒ ඇසුරින් වඩාත් අර්ථාන්විත හා අර්ථය ව්‍යාකූල නොවන පරිදි ළ, ල අකුරු භාවිතයට මඟපෙන්වීමක් ලැබේ. එම රීතීන්ට අනුකූලව මූර්ධජ ළ හා දන්තජ ල භාවිතය තුළින් හෙළ බසෙහි නිවැරදි ව්‍යවහාරය මෙන්ම භාවිතය හඳුනා ගැනීමට අවශ්‍ය ඉඩ හසර නිර්මාණය වනු ඇත.

රජුගේ ගෞරවයට පාත්‍ර වනුයේ දැනුම මිස ධනය නොවේ.
“විද්‍යා රාජු පූජියතේ නහි ධනං”
( Even King honour the knowledge )



කපිතාන් දිල්හාරා දිසානායක ජාශිබ
BA sp (Hons), MA, PGDE,PGDC
Dip in Eng. Dip in Pali. Dip in Astr.
ප්‍රකාශන අංශය ශ්‍රීලංයුහසෙව්බමු



# නිර්මාණ අසපුව ...

## කොරෝනා කාලේ ආලේ

අරාගෙන එන වෙසෙස් රෝග ඇති වංගියේ
තරාතිරමක් නොමැත සැවොම එක පංතියේ
දරාගෙන කඩතුරා සුව පිණිස නංගියේ
සරාසඳ වඩින තුරු ඉදින් ගම් මණ්ඩියේ

හැඩ වෙච්චි ලෝකයේ දුකට පාවඩ එලා
ගුලි වෙච්චි ජීවිතේ විෂබීජ තැවරිලා
තනි වෙච්ච කාලයේ හැඟුම් සිරගත වෙලා
වැඩි වෙච්ච සෝගින්න සිත දවා අළුකළා

මුව පුරා සිනා කැන් නෙත් කැළුම් සඟවලා
මුව වසා ගොළුවෙලා දෙතොල් දළු මැලවිලා
නුඹ ගෙනා අරුමැසිය ඉඟි බිඟිය දළුලලා
ළඟ නිවාඩුවේ ඇවිත් වැළඳ ගමු සැනසිලා

කපිතන් දිල්හාරා දිසානායක

## එකාවගේ රකිනවා ලක්මෑණි ...


බුදුන් වැඩිය මේ සිරිපා පතුළ මත
සිරස තබමි,නමදිමි සංවරව සිත
රෝ බිය දැනෙයි බිහිසුණු ලෙස සතර අත
දළදා සමිදුනේ රැකදෙනු මෙ පිං කෙත

ගන්නට හුස්ම නොහැකි ලෙඩ ඇදන් මත
ජීවය යදිනවා නොමැතිව දිරිය ගත
සුරිඳුනි කතරගම වැජඹෙන දෙවොල මත
රැකදෙනු දනන් දල්වා සිට ඔබේ නෙත

කොරෝනා රැල්ල දවසින් දවසම ආවා
විශාලා නුවර තුන් බිය මතකය පෑවා
තෙරුවන් බලෙන් සැම දෙනටම සුව වේවා
සිරිලක් මවට යළි සෝ දුක් නොමවේවා

සුරංග සෙනවිරත්න
රණවරුණ පාඨක

## අදත් එදා වගේ නම් ...



ඉස්කොලේ ගියා ඉගෙන ගන්න
ඇතිතරම් සෙල්ලම් කලා
ඇලේ, දොලේ, වැවේ, ගඟේ ඇති තරම් දිය නෑව
කැලෑවට රිංගලා ගාඩා ගෙඩි කෑවා
දුරාචාරයට හුරු උනේ නෑ කිසිවිටෙක
අම්මා උයපු බත්පත අරගෙන
අල්ලපු ගෙදරට පැනලා
හොදි මාළු බෙදාගෙන කෑවා
රේඩියෝවෙන් මුවන් පැලැස්ස මොණරතැන්න
සඳගලතැන්න යකාගේ වංගුව වීර පුරන් අප්පු
වැනි වැදගත් කතා ඇසුවා ....
ඇලට පහළට දඩබ්බරකමට
තිත්ත පැටවු අල්ලලා
අම්මගෙන් ගුටි කෑවා
අර ඈත නෑදෑයන්ට ලිපි යැව්වා
පෑනේ මිතුරන්ට ලිපි ලිව්වා
වෙසක් එකට වෙසක් කාඩ් යැව්වා
යාළුවන් සමග උසුලු විසුලු කරමින් පාඩම්කරා
පහේ විභාගය දහයේ විභාගය උසස්පෙළ
කියලා මැරි මැරි ඉපදුනේ නෑ
අවුරුදුවලට නෑගම් ගියා බුලත් අතක් දිලා
වැදුම් පිදුම් කලා....
අම්මා උයන කැවුම් කකා
ඔංචිලි වාරම් කියමින් ඔංචිලි පැද්දා
හරිම සරලයි  සැහැල්ලුයි සුන්දර මතකයන්
අදත් එදා වගේ නම් ...?

බනි II පතිරණ එම්එම්එම්එන්
9(සෙව්) ඉසේරෙ  සඳහිරු සෑය

වසර 140 ක අභිමන් ඉතිහාසයක් හිමි ස්වේච්ඡා බළසේනාවේ සුවිශේෂී වූ මතක සටහන්

# දුටු නුදුටු අතීත මතක ...

තුළින් මෙවර කළාපයේ සිට අපි ඔබට ගෙන එන්නෙමු



**ලංකා පාබල හමුදාවේ සාමාජිකයන් අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් ඒච්සී බර්ඩර් වීඩී (ඉදිරි පෙළ මැද) සමඟ 1903 වසරේදී දියතලාව කඳවුරේදී ලබාගන්නා ලද ඡායාරූපයකි.**

(2 (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදාව සතු පැරණිතම ඡායාරූපවලින් එකකි)

# ඒ මමද ...

අම්මාගේ සුලැඟිල්ලේ එල්ලිලා පාසලට
අකුරු කරවීම වස් හඬ හඬා ගිය අයුරු
පන්තියේ කෙටි බැම්ම උඩින් හිස ඔසවලා
ඇය හිඳී දැයි බැලූ සිඟිත්තා ... ඒ මමද ?

බක් මහේ අවුරුද්දේ තරඟයෙන් ජය ලබා
කුසලාන තෑගි මලු පොදි පිටින් ගෙන ලබා
පාසලේ සියලු වැඩ කරපිටට ගෙන දමා
විභාගය නොම කෙරූ ශිෂ්‍යයා ... ඒ මමද ?

ගතින් පිරිපුන් වෙලා සිතින් ඔද වැඩිවෙලා
මවගේ කිරි හා දෙරණේ ණය ගෙවීමට සිතා
පන්හිඳට කැමති අත ඒ දෙසට නොම යොදා
ගිනි අවිය වැළඳගත් සෙබල පුතු ... ඒ මමද ?

හිසේ කෙස් අඩුවෙලා තියෙන කෙස් සුදු වෙලා
සංසාරේ පතා ආ බිරිඳ මගෙ ජීවය වෙලා
අත් දෙකේ සුළැඟිල්ලේ පොඩි දෙන්නා එල්ලිලා
ජීවිතේ සුන්දරයි දෙවියනෙ ... මේ මමද ?



කර්නල් කේ ටී එච් හරිප්‍රිය ආර්එස්පී
කර්නල් පුහුණු ශ්‍රීලංයුහසෙව්බමු



දිවියට සුවයක්..

"රණවරුණ" මෙවර කලාපයේ දිවියට සුවයක් තුළින් ඔබට ගෙන එනුයේ **මලබද්ධය පිළිබඳවයි ..**

## මලබද්ධය රෝගයක්ද ? රෝග ලක්ෂණයක්ද?

**මලබද්ධය යනු ?**

මලබද්ධය පිළිබදව අර්ථකථනය පුද්ගලයාගේ පුද්ගලයාට වෙනස් වේ. මලපහ කරන විට කිසිදු අපහසුතාවක් නැතිව මෘදු වූ මල ඔබ සෑහීමට පත්වූ අයුරින් ඉවත් වූවා නම් ඔබට මල බද්ධයක් නැත. එහෙත් වෙනදා මලපහ වූ ආකාරයට වඩා වෙනස් වී දින ගණන් පසු වී මලපහ වන්නේ නම් ද, එම මලපහ වෙනදාට වඩා ඝණ වී බෙරි බවට පත්වී ඇත්නම් සහ මලපහ කරන විට අපහසුතාවක්ද, වේදනාවක්ද දැනෙන්නේ නම් ඒ මලබද්ධය නිසා විය හැකියි. යමෙක් වෛද්‍යවරයකු හමුවිය යුත්තේ ඉහත සඳහන් රෝග ලක්‍ෂණ හටගතතොත් පමණි.

එසේ නැතිව හිතුමතේට විරේක පෙති සහ ඖෂධ ගැනීම නම් අනුවණකමකි. ඔබ දන්නවාද? එලෙස විරේක පෙති සහ ඖෂධ වර්ග ගැනීම නිසා මහබඩවැල දුර්වල වීමේ හේතුවෙන්ද මලබද්ධය ඇතිවිය හැකිය. එබැවින් විරේක ඖෂධ ගත යුත්තේද කල්පනාවෙනි.

**අපේ අන්ත්‍රවල ක්‍රියාකාරිත්වය.**

අප කටට දමා ගන්නා ආහාර කැබලි හා දියර වර්ග සියල්ලම ආහාර මාර්ගයේදී ජීර්ණ ක්‍රියාවලියට ලක්වෙයි. අවසානයේදී ඒවා ප්‍රෝටීන, සීනි, තෙල් සහ ඛණිජලවණ බවට පත්වී රුධිරවාහිනී තුළට උරාගනී. ආමාශයේ ඇති ආම්ලික මාධ්‍ය තුළ ප්‍රධාන ජීර්ණ ක්‍රියාවලිය ඇරඹෙන අතර ජීර්ණය වූ ආහාර අවශෝෂණය ප්‍රධාන වශයෙන් සිදුවන්නේ මහාන්ත්‍රය තුළය. ආහාරයේ අවශේෂය නැතිනම් ඉතිරි රොඩ්ඩ මහාන්ත්‍රය කරා ගමන් කරන අතර, එහි ප්‍රධාන වශයෙන් අඩංගු වන්නේ ජීර්ණයට ලක් නොවූ කෙඳි වර්ග සහ අප සිරුරේ පරිවෘත්තීය ක්‍රියාවලියේදී ඉවත් වූ කැඩී බිඳී ගිය රතු සෛල පිත්තාශයේ හටගත් පිත්ත වර්ණක සහ ජලයයි.

මහාන්ත්‍රයේ පිහිටා ඇති පේශීන් සංකෝචනයවීම මගින් මලපහ ගුදය දෙසට තල්ලු වී යයි. මෙහිදී මලවල ඇති ජලය තවදුරටත් මහාන්ත්‍රයට උරාගැනීම නිසා මලපහ ඝන බවට පත්වේ. මලපහවල මෘදුබව ඇතිවීමට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ එහි ඇති තන්තු ප්‍රමාණයයි.

පානය කරන ජල ප්‍රමාණය අඩු නම් හෝ අධික ව්‍යායාම නිසා හෝ හිරු එළියේ වැඩි වේලාවක් ගත කිරීම හේතුවෙන් අධික වශයෙන් දහදිය දමයි නම් මහාන්ත්‍රයෙන් මලපහවල ඉතිරිව ඇති ජලය සියල්ලම උරාගැනීම නිසා මල අධික ලෙස ඝණවී මලපහ කිරීම අපහසු විය හැක. අප ගන්නා තන්තුමය ආහාර ප්‍රමාණය අඩුවීමද මෙයට හේතුවකි.

එයින් පළතුරු, පළාකොල සහ එළවලු වර්ග, නිවුඩුහාල් වැනි දෑ ආහාරයට එකතු කර ගැනීමත් අවශ්‍ය ප්‍රමාණයට ජලය පානය කිරීමත් අවශ්‍ය තරමට ව්‍යායාම කිරීමත් නිසා නිරෝගී අයට මලබද්ධය ඇතිවීම වළක්වා ගත හැක.

අවුරුදු 35 ට වැඩි පුද්ගලයන් හට බඩ වේලීම (මලබද්ධය) සහ බඩ බුරුල්වීම (පාචනය) මාරුවෙන් මාරුවට සිදුවීමත් සමග යටි බඩේ වම්පස වේදනාවක් වරින් වර ඇති වුවහොත් එම රෝගී තත්වය Irritable Bowel Syndrome (IBS) නැමති රෝගය විය හැකිය. එම රෝග ලක්‍ෂණවලට අමතරව බඩ පිපුම් ගතිය සහ ඔක්කාරය එහිදී සිදුවිය හැක.

**IBS රෝගය**

Irritable Bowel Syndrome රෝගී තත්වය ඇති අයට මලපහ කිරීමෙන් පසුව නැවත මලපහ කිරීමේ අවශ්‍යතාවයක් දැනේ. සමහරවිට මලපහවල හැඩය වෙනස් වී සිහින් පැතලි දිගටි රිබන් ස්වරූපයක් ගත හැක. මලපහ සමග රුධිරය පිටවීමටද පුළුවන, කාන්තාවන්ට වැඩිපුර ඇතිවන මෙම රෝගී තත්වය සිත් තැවුල් කරදර ඇති කාලයේදී උත්සන්න විය හැක.

මෙම රෝගී තත්වය බොහෝ විට කාන්තාවන්ගේ ස්ත්‍රී ලිංගික පද්ධතිය හා සම්බන්ධ රෝග, ආමාශයේ තුවාල සහ ඇපෙන්ඩිසයිටි රෝගය සමඟ වරදවා තේරුම්ගත හැක. මලමුත්‍ර හා රුධිර පරීක්‍ෂණය හා Sigmoidoscopy, Aidj කළ පසුවත් වෙනත් රෝගයක් නොමැතිබව ස්ථිරව දැන ගැනීමෙන් පසුව ඔබට ඇත්තේ IBS රෝගය බව තීරණය කිරීමට පුළුවන.

ඉතිරිය 29 පිටුවට



# සිය පරාජය තුළ අතිවිශිෂ්ට ජයග්‍රහණයක් සනිටුහන් කළ

## යුද හමුදා කෝප්‍රල්වරයා



විශිෂ්ට පරාජයන් තුළ අතිවිශිෂ්ට ජයග්‍රහණයන් සැඟව ඇති බව පසක් කරවමින් ඔලිම්පික් ඉතිහාසය පුරාම සිය නාමය රන් අකුරින් සනිටුහන් කළ විශිෂ්ට ශ්‍රී ලාංකේය ක්‍රීඩකයෙකු පිළිබඳව මතකය අවදි වනුයේ 2020 ඔලිම්පික් උළෙලේ සමාරම්භයත් සමඟිනි. ඔහු අන් කවරෙකු නොව, වර්ෂ 1964 ජපානයේ පැවති ඔලිම්පික් තරඟාවලියේ දී මීටර් 10,000 දුර දිවීමේ තරඟාවලියෙන් ලංකාව නියෝජනය කිරීමට ඉදිරිපත් වූ යුද හමුදා ක්‍රීඩක කෝප්‍රල් රණතුංග කරුණානන්දයි.

එම ඔලිම්පික් තරඟාවලිය නියෝජනය කළ යුද හමුදා කෝප්‍රල් රණතුංග කරුණානන්දට තරඟ කිරීමට සිදුවූයේ ඇමෙරිකාව, ඕස්ට්‍රේලියාව, ටියුනීසියාව ආදී ලොව ඉතාමත් ප්‍රමුඛ පෙළේ රටවලින් පැමිණි වෘත්තීය මට්ටමේ මලල ක්‍රීඩකයන් රැසක් සමඟිනි.

කෙසේ වුවත් තරඟය ආරම්භ කිරීම වෙනුවෙන් ආරම්භක වෙඩිල්ල ක්‍රියාත්මක වූ සැනින්, කරට කර සූදානමින් එක පොකුරට සිටි තරඟකරුවන් සියලු දෙනා එකිනෙකා පරයමින් වේගයෙන් දිවයද්දී මදක් අසනීප තත්වයෙන් පෙළෙමින් සිටියදී වුව, ඒ ගැන කිසිදු තැකීමක් නොකළ කෝප්‍රල් කරුණානන්ද තමාට හැකි උපරිමයෙන් එම ධාවන පථය තුළ දිව ගියත් වට දහයක් අවසන් වෙද්දී තරඟාවලියට සහභාගි වූ සියලුම ක්‍රීඩකයන්ගේ අන්තිමයා බවට පත්විය. එමෙන්ම තමාට වඩා ශරීර දේහ ප්‍රමාණයෙන් විශාල, ලොව බලවත් රටවල් රැසක මලල ක්‍රීඩකයන් පසුපස, තරඟය ආරම්භ කළ වේගයෙන්ම තවදුරටත් දිව යමින් එම තරඟයේ ඉතිරි වට කිහිපය සම්පූර්ණ කිරීමට ඔහු සමත් විය.

එමෙන්ම, එම තරඟාවලියේ 20 වන වටයේ ආරම්භයත් සමඟින් ලොව සුපතළ දුර ධාවකයෙකු වන ඇමරිකාවේ බිලී මිල්ස් විනාඩි 28 යි තත්පර 17.6 කින් එම තරඟය නිමා කරමින් තරඟාවලියේ රන් පදක්කම්ලාභියා බවට පත් වූ අතර, තරඟයේ දෙවන හා තෙවන ස්ථාන වෙනුවෙන් ද ඒ වන විටත් ජයග්‍රාහකයන් තේරී පත් වී තිබුණත් ලංකාව නියෝජනය කරමින් තරඟවැදී සිටි කෝප්‍රල් කරුණානන්ද පමණක් තවදුරටත් තරඟබිම තුළ රැඳී සිටිමින් එම තරඟය නිමා කිරීම සඳහා නියමිතව තිබූ ඉදිරි වට හතරද සම්පූර්ණ කිරීමේ අධිෂ්ඨානය සහිතව ඔහු තමා තරඟය ආරම්භ කරන අවස්ථාවේ ලබාගත් වේගය ඒ අයුරින්ම පවත්වා ගනිමින් ඉදිරි වට කිහිපය සම්පූර්ණ කිරීම සඳහා නොපසුබස්නා අධිෂ්ඨානයෙන් යුතුව තව දුරටත් දිවයන ලදී. එම මොහොතේ ඔහු දෙස මුළු ප්‍රේක්ෂකාගාරයම මහත් කුතුහලයෙන් බලා සිටියේ ඒ වන විටත් තරඟාවලිය වෙනුවෙන් සහභාගී වෙමින් තිබූ අනෙකුත් ක්‍රීඩකයන් රැසක්ම තරඟය අතහැර දමා ධාවන පථයෙන් ඉවත්ව තිබූ නිසයි. කෝප්‍රල් කරුණානන්ද පමණක් තවදුරටත් එම තරඟබිම තුළ නොපැකිළව දිව යද්දී ප්‍රේක්ෂකාගාරය තුළ සිටි ඇතැම් ප්‍රේක්ෂකයන්ගේ උසුළු විසුළුවලට පවා ලක්වීමට පළමු වටය තුළදී ඔහුට සිදු විය. කෙසේ වුවත් ඔහු පළමු වටය අවසන් කර දෙවන වටයට පිවිසෙන විට, එතෙක් ඔහුට උසුළු විසුළු කරමින් සිටි නරඹන්නන් සියලු දෙනාම නිහඬ විය. එමෙන්ම අතරින් පතර පොඩි අත් අත්පොළසන් නාදයක් ද පැතිර ගිය අතර තරඟය නිමා කිරීම වෙනුවෙන් අවසන් කළ යුතු තුන්වන වටය නිමා කරද්දී තරඟය නැරඹීමට පැමිණ සිටි මුළු ප්‍රේක්ෂකාගාරය ම ඔහු වෙනුවෙන් ඔල්වරසන් දෙමින් ජයඝෝෂා නැගුවේ සියල්ලන්ම මවිතයට පත් කරවමිනි. එමෙන්ම තරඟයේ අවසන් වටය ඔහු නිමා කරනුයේ "කමෝන් සිලෝන්" "කමෝන් සිලෝන්" යනුවෙන් මුළු ප්‍රේක්ෂකාගාරය ම නැගී සිට ප්‍රීතියෙන් ප්‍රමෝදයට පත් වී ඔහුට ඔල්වරසන් දෙමින් ජයඝෝෂා නගද්දීය. තරඟාවලිය නිමා කළ කෝප්‍රල් කරුණානන්ද යළි ප්‍රේක්ෂකාගාරය වෙත පිවිසෙද්දී ඔහු වෙත දිව ආ තරඟයේ ජයග්‍රාහක ඇමරිකාවේ බිලී මිල්ස් කෝප්‍රල් කරුණානන්දට සුබ පතමින් පැවසුවේ තරඟය ජයග්‍රහණය කිරීම වෙනුවෙන් ලැබිය යුතු රන් පදක්කමේ සැබෑ හිමිකරුවා වනුයේ ඔබ බවයි.

කෙසේ වුවත් මේ සිද්ධියත් සමඟින් දෙවන ලෝක යුද්ධයෙන් විනාශයට පත් ජපානයට පවා විශාල ආදර්ශයක් ගෙන දීමට ශ්‍රී ලාංකිකයෙකු වූ කෝප්‍රල් රණතුංග කරුණානන්ද සමත්වීම ජාතියට ආඩම්බරයකි. ඔහු එම තරඟාවලිය පුරා දැක්වූ විශිෂ්ට සහභාගීත්වය මෙන්ම ඔහු තුළ තිබූ නොපසුබස්නා උත්සාහය හා අධිෂ්ඨානය පිළිබඳව ප්‍රසාදයට පත් ජපන් බලධාරීන් එරට පාසල් පෙළ පොත් වලට පවා කෝප්‍රල් කරුණානන්දගේ කතාව ඇතුළත් කොට තිබුණේ ශ්‍රී ලංකාවට ද ඉමහත් කීර්තියක් අත්පත් කර දෙමිනි.

**ලුතිනන් දුමින්ද සෙනරත් ශ්‍රීලයුපොදුසේබ**
**ජනමාධ්‍ය අධ්‍යක්ෂක මණ්ඩලය**
**යුධ හමුදා මූලස්ථානය**

**දශක තුනක යුද්ධය නිමවී වසර 13 කට ආසන්නය. නිදහස හා සාමයේ ප්‍රතිලාභ භුක්ති විඳිමින් සමස්ත රටවැසියන් සිය ජීවන අරගලයන්හි නිරතව සිටින අතරතුර රණවිරුවෝද එතෙක් කලක් තම අතරැඳි ගිනි අවි පසෙකලා නිහඬ මෙහෙවරක නියැලී සිටිති. එවක සටන් පැවති උතුරු නැගෙනහිර බිම්කඩ පුරා ඇරඹි සංවර්ධන සංග්‍රාමයේ ප්‍රතිඵලයක් ලෙස එහි පෙර වූ යුද්ධයේ නටඹුන් සහමුලින්ම මැකී ගොස්ය.**

**සියල්ල එසේ වුවද රණබිමෙහි මානුෂීය ගුණ රැඳි මතක සටහන් එලෙස මැකී යා නොදී සමාජගත කිරීම කාලීන අවශ්‍යතාවක් සේ හැඟේ. රණවිරුවන් සතුව තිබූ වීරත්වය, දේශානුරාගය, බිය, සැක, දුක, වේදනාව හා සතුට හමුවේ ඔවුන් සිය ජීවිතවලට මුහුණ දුන් අපූරුවද එකී මතක සටහන් විශ්ලේෂණය කිරීමේදී කදිමට විද්‍යමාන වේ.**

**" පය ඇඳි බිම ළය රැඳි මතක " තුළින්**

**දිගහැරෙනුයේ එදවස රණබිමේ සැඟවුණු සුන්දර කතන්දරයි ...**



# පය ඇඳි බිම ළය රැඳි මතක

සොල්දාදුවෙකු ලෙස හමුදා සේවයට එක්වන සෑම අයෙකු තුළම තම රට වෙනුවෙන් ඇත්තේ අසීමිත ආදරයකි. රටට ආදරය කරන ඒ සෑම සෙබළෙකුම සිය මවටද ආදරය කරයි. රටට හා මවට ආදරය නොකරන කිසිවකුට සැබෑ යුද සෙබළෙකු විය නොහැකිය.

අනුරාධපුර තලාව ප්‍රදේශයේ පදිංචි අයෙකු වූ කෝප්‍රල් ජයසේකර එවක මා රාජකාරි කළ මුලතිව්හි පිහිටි කඳවුරක සිටි ක්‍රියාශීලී නිර්භීත සෙබළෙකි. කඳවුරෙහි සෑම වැඩ කටයුත්තකදීම කැපී පෙනෙන අයෙකු වූ ඔහු තරමක් සැරපරුෂ ගති ඇති අයෙකි. විශේෂයෙන්ම තමන් යටතේ වූ සෙබළුන්ට කිසිදු වැරැද්දකදී ඔහුගෙන් සමාවක් නොලැබුණි. මේ හේතුවෙන්ම එහි සිටි කණිෂ්ඨ නිලයින් සෑම අයෙකුම පාහේ ඔහුට දැක්වූයේ බියකි. බොහෝ දරදඬු ගති ඇති අයෙකු වන ඔහු සෙබළුන්ගේ අප්‍රසාදයට ලක්ව සිටියේ නිතරම ඔහුගෙන් දඬුවම් විඳීමට සිදුවන හෙයිනි. පෙනුමෙන් වුවද හැඩිදැඩි කලු පුද්ගලයෙකු වූ ඔහු පමණ ඉක්මවා කෝපවන අයෙකු ලෙසද ප්‍රසිද්ධය. කෙසේ වුවද විනයගරුක සෙබළෙකු වූ කෝප්‍රල් ජයසේකර කඳවුරෙහි රාජකාරි කටයුතුද මැනවින් ඉටුකළ අයෙකි.

එක්තරා උදෑසනක කඳවුර මධ්‍යයේ පිහිටි භටනිවාසය දෙසින් ඇසුණේ කිසිවකු ඉකිබිඳින හඬකි. එවන් ඉකිබිඳුමක් ඊට පෙර අසා නොතිබූ බැවින් මා ඒ පිළිබඳ විමසිලිමත් විය. එහිදී මා හට දැන ගන්නට ලැබුණේ කෝප්‍රල් ජයසේකරගේ මව මිය ගොස් ඇති බවත් පණිවුඩය ලද සැනින් වාවාගත නොහැකිව ඔහු එසේ හඬන බවත්ය.

කෝප්‍රල් ජයසේකර කෙතරම් සැඩ පරුෂ තද ගති ඇති අයෙකු වුවද සිය මවගේ වියෝව හමුවේ ඔහු හඬා වැටෙන්නට වූයේ පොඩි ළමයෙකු පරිද්දෙනි. තම මව මිය යාම යනු ඕනෑම අයෙකුට දරාගත නොහැකි කාරණයක් බව සැබෑ වුවත් කෝප්‍රල් ජයසේකර වැනි කෙනෙකු ඒ ආකාරයෙන් විලාප දීම මට මෙන්ම කඳවුරෙහි සෙසු අයටද පුදුම දනවන කරුණක් විය. කොතරම් දරඬු සිත් ඇති සැඩපරුෂ අයෙකු වුවද එකී සෙබළාගේ නිලඇඳුම යට සැඟවුණු මානුෂීය ගුණ කෙබඳුද යන්න ඔහුගේ එම හැසිරීම හරහා ඉස්මතු වී පෙනිණ.

ආරංචිය ලද සැනින් ඔහුව කැඳවා හැකි පමණ ඔහුව අස්වසාලීමට මම උත්සාහ කළෙමි. ඒ සමගම දින 10 ක නිවාඩුවක්ද ලබා දී කඳවුරෙහි වූ ජීප් රථයෙන් ඔහුව යාබද පිහිටි "මල්ලාවි" නගරය තෙක් ඇරලවීමටද මම කටයුතු කලෙමි. පසුව කඳවුරෙන් තවත් සෙබළු කිහිප දෙනෙකුද එහි පිටත්කර යැවූ මා අවශ්‍ය සියලු පාලන අවශ්‍යතාද සපුරාලීය.

පසුව අවමඟුල් කටයුතු සියල්ල අවසන්ව ඔහු නැවත කඳවුර වෙත පැමිණි දිනයක මම ඔහු සමඟ බොහෝ වේලාවක් කතාබහ කරන්නට වීමි. එහිදී ඔහු තම මව හා බැඳුණු බොහෝ තොරතුරු මා සමඟ පවසන්නට විය. ඒ වනවිටත් අවිවාහකව සිටි කෝප්‍රල් ජයසේකරගේ පියාද නොවීය. තම එකම රැකවරණය වූ මවට ඔහු

## රණබිමෙන් අම්මාට ....

රෑ මැදියමේ මා ගම රට එනදාට
නුඹ ඇති පැලේ පිල්කඩ එළියයි දුරට
අම්මේ ඔබ නොදුටු තුන්මාසය නෙතට
ඇති මහ සයුර පුරවන්නට කඳුළු කැට

දුම් දැලි පිරුණු කුස්සිය මුල්ලේ කොනක
දහඩිය කඳුළු නුඹෙ ගබඩාවක් ලෙසක
නොකිලිටි වූ දෙයක් තිබුණොත් එකම එක
සෙනෙහස පමණි නුඹ මට පිදූ පෙර දිනක

හිරු මෙන් එළිය දී දිවිමග සරු කෙරුණි
මාගෙන් සුවය ලැබ නුඹෙ හදවත තෙමුණි
සවිබළ මෙමට ඔබ ලොකු දිරියක් මවුනි
නොහඬන් ඉතින් මා නුඹ ළඟ නැති සොවිනි

නුඹෙ උණුසුමින් මට දැනුණේ නැහැ සීත
විරුවන් රකිනවලු දෙවියන් සිට ඈත
රණබිම ජය අරන් එන දින ළඟ පාත
දිව්රන්නද අම්මෙ අල්ලා ඔය දෑත



බෙහෙවින් ආදරය කලේය. ඔහු නිවාඩුවට නිවසට යන සෑම අවස්ථාවකදීම සිය මව නිදිවර්ජිතව බලා සිටින අයුරුද ඔහු මා හමුවේ සිහිපත් කළේය.

ඉහත සිදුවීමෙහි විශේෂත්වය නම් කඳවුර තුළදී කෝප්‍රල් ජයසේකර පෙන්වූ දරදඬු හැසිරීම හරහා ඔහු වැන්නෙකු සතුව මෙතරම් තෙත් හදවතක් ඇති යැයි කිසිවකු විශ්වාස නොකිරීමය. මම පසු දිනෙක ඔහුගේ හදවතෙහි සිය මව හා බැඳුණු ඇල්ම පිළිබඳ මෙලෙස අකුරු කරන්නට වූයේ සෑම යුද සෙබළෙකු තුළම මතුපිටින් නොපෙනෙන බොහෝ සංවේදී හදවතක් සිය නිලඇඳුම යට සැඟව තිබෙන බැව් යළි යළිත් පසක් කරමිනි.



**මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ**

## දිවියට සුවයක් 26 පිටුවෙන් ...

**දීර්ඝ කාලීන මලබද්ධය**

තන්තු අඩු ආහාර ගැනීම, අවශ්‍ය තරම් ජලය පානය නොකිරීම හා අලස දිවි පැවැත්ම හේතු වන අතරම කාලයක් තිස්සේ විරේක පෙති භාවිතයද මගින් දීර්ඝකාලීන මළබද්ධය ඇතිවිය හැක.

**මළබද්ධය ඇතිවිය හැකි ඖෂධ**

ප්‍රධාන වශයෙන් Codein අඩංගු වේදනා නාශක, කැස්සට භාවිතා කරන සිරප් වර්ග, මෝෆීන් නැමති ප්‍රබල වේදනා නාශක නිසාත් මලබද්ධය ඇතිවිය හැක. තවද අධි රුධිර පීඩනය පාලනය කරන Verapamil ඖෂධ මානසික අවපීඩනයට භාවිතා කරන TCA ඖෂධ නිසාත් බොහෝ විට මලබද්ධය ඇතිවේ. Sedatives වර්ග සහ Antacids වර්ග භාවිතයෙන්ද මලබද්ධය ඇතිවිය හැක.

**මලපහවල වර්ණ විපර්යාස**

මලපහ සමග තද රතු පැහැති රුධිරය පිටවන්නේ නම් ඒ බොහෝ විට අර්ශස් රෝගය (Piles) නිසා විය හැකිය. IBS රෝගය නිසාත් Ulcerativs Colitis හෙවත් Crohns Disease නැමති මහාන්ත්‍රයේ වණවීම නිසාත් මල සමග රුධිරය වහනය වේ. ආමාශයේ හා කුඩා අන්ත්‍රයේ තුවාලවීම නිසා රුධිරය වහනය සිදුවුවා නම් එම මල කලු තාර ස්වභාවයක් ගනී. ඇතැම් ඖෂධ වර්ග නිසාද මලවල වර්ණ විපර්යාසයක් සිදුවිය හැක.

**සැකසුම :**

**බනි 1 කේ.එච්.කේ ජයවික්‍රම යුඑස්පී**
**පුහුණු හෙද**
**ශ්‍රීලංයුහසෙව්බමු**

# සුබ මොහොතින් නව තනතුරු ලැබ ...



ශ්‍රීලංයුහසෙව්බමු
කර්නල් පුහුණු ලෙස
කර්නල් කේ ටී එච් හරිප්‍රිය
ආර්එස්පී



ශ්‍රීලංයුහසෙව්බමු
හකාස ශාඛාවේ
මානි 1 (හකාස) ලෙස
ලුතිනන් කර්නල් එම් කේ ඒ
ඩී චන්ද්‍රමාල් විපාරෙ



ශ්‍රීලංයුහසෙව්බමු
නිලධාරී ශාඛාවේ මානි 1
(පත්කිරීම්) ලෙස ලුතිනන්
කර්නල් කේ ඒ ඩී පී
සුගතදාස යූඑස්පී ශ්‍රීලංඉ



ශ්‍රීලංයුහසෙව්බමු
නිලධාරී ශාඛාවේ මානි
1 (නිලධාරී උසස් කිරීම්
කණිෂ්ඨ) ලෙස ලුතිනන්
කර්නල් පී ඒ එම් වික්‍රමසිංහ
ශ්‍රීලංජාආබමු



ශ්‍රීලංයුහසෙව්බමු
හකාස ශාඛාවේ මානි 1
ලෙස ලුතිනන් කර්නල්
ඩී එල් ආර් එදිරිසිංහ
ශ්‍රීලවියාඉ



2 ශ්‍රීලංරබ
අණදෙන නිලධාරී ලෙස
ලුතිනන් කර්නල් කේ ජයවීර
ශ්‍රීලසසබ



3 (සෙව්) ශ්‍රීලංසිරෙ
අණදෙන නිලධාරී ලෙස
මේජර් ඩබ් ජී ටී ඩබ් ඒ එම්
ආර් පී එස් බෝයගොඩ
ආර්එස්පී



10 (සෙව්) ඉසේරෙ
අණදෙන නිලධාරී ලෙස
මේජර් ආර් පී ඒ රෝහණ
එල්එස්සී ඉසේබ



15 (සෙව්) ශ්‍රීලංඉ
අණදෙන නිලධාරී ලෙස
මේජර් ආර් එම් ප්‍රියදර්ශණ
ශ්‍රීලංඉ



4 ඉසේරෙ
දෙවන අණදෙන නිලධාරී
ලෙස මේජර් ඩබ් සී දේශප්‍රිය
ඉසේබ



2 ශ්‍රීලංරබ
දෙවන අණදෙන නිලධාරී
ලෙස මේජර් ඩී එම් අයි
එස් පී දිසානායක ශ්‍රීලංරබ



ශ්‍රීලංයුහසෙව්බමු
මූලස්ථාන බළඇණියේ
පාලන කණ්ඩායම්
නිලධාරී අණදෙන ලෙස
මේජර් වී වී පෙරේරා
ශ්‍රීලංජාආබමු

# සුබ මොහොතින් නව තනතුරු ලැබ ...



ශ්‍රීලංයුහසෙව්බමු
ප්‍රධාන ශාඛාවේ
ප්‍රමානි II (පුහුණු) ලෙස
මේජර් එම් අයි රුවන්
කුමාර ගරෙ



ශ්‍රීලංයුහසෙව්බමු
නිලධාරි ශාඛාවේ මානි II
(පත්කිරීම්) ලෙස මේජර්
පේ එල් ඒ යු අබේරත්න
පීඑස්සී විපාරෙ



ශ්‍රීලංයුහසෙව්බමු
නිලධාරි ශාඛාවේ
මානි II (පුද්ගලික ලිපිගොනු)
ලෙස මේජර් පී එම් පී ඩී බී
ගුණරත්න ශ්‍රීලයුකාබ



ශ්‍රීලංයුහසෙව්බමු
ප්‍රධාන ශාඛාවේ
ප්‍රමානි III (පුහුණු) ලෙස
කපිතන් ඩබ් ඩී එම් කේ
වික්‍රමසිංහ ගැහේබ



11 ශ්‍රීලංසිරෙ
විධායක අධිකාරි ලෙස
කපිතන් ඩී පී කේ එම්
සේනාරත්න ශ්‍රීලංසිරෙ



2 ගරෙ
විධායක අධිකාරි ලෙස
කපිතන් එස් ආර් වී කේ එස්
බණ්ඩාර ගරෙ



5 ගරෙ
විධායක අධිකාරි ලෙස
ලුතිනන් ඩබ් ඒ පී බුද්ධික
ගරෙ



2 ගරෙ
බුද්ධි නිලධාරි ලෙස
2/ලුතිනන් එම් පී බී මෙන්ඩිස්
ගරෙ



5 ගරෙ
බුද්ධි නිලධාරි ලෙස
2/ලුතිනන් කේ පී එම් ඒ
හෙට්ටිආරච්චි ගරෙ



1 ශ්‍රීලංරබ
සරඹ උපදේශක ලෙස
බළලත් නිලධාරි II
වික්‍රමසිංහ කේජීආර්ඒ



2 ශ්‍රීලංරබ
සරඹ උපදේශක ලෙස
බළලත් නිලධාරි II
ජයවර්ධන එම්ඩීයූඑස්



2 ගරෙ
ප්‍රධාන ලිපිකරු ලෙස
වර්ණ සැරයන් මහින්දසේන
ඒඑම්

# ප්‍රහේලිකාව

## 8

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 ඉ | | | | 2 | ■ | 3 දෙ | | | 4 න |
| | ■ | ■ | ■ | බ | ■ | | ■ | ■ | |
| 5 | | 6 ලා | | ■ | 7 | | ■ | ■ | දි |
| | ■ | | ■ | ■ | හු | ■ | 8 සැ | | |
| 9 පා | | | ■ | 10 හු | ■ | ■ | | ■ | |
| | ■ | ■ | ■ | | ■ | 11 යෙ | | ■ | ■ |
| ■ | ■ | ■ | 12 ප | | ස | ■ | | ■ | 13 ල |
| 14 ව | ■ | 15 අ | ■ | ට | ■ | ■ | 16 රා | | |
| 17 | තු | | | | ■ | 18 | ■ | ■ | |
| | ■ | ප | ■ | ■ | ■ | 19 පු | | සි | |

"රණවරුණ පාඨක" ඔබගේ වින්දනයට සහ දැණුම උදෙසා ඉදිරිපත් කරනු ලබන ප්‍රහේලිකාව සම්පූර්ණ කර අප වෙත එවන මෙන් ඉල්ලා සිටිමු. ජයග්‍රාහී පාඨකයා ඊළඟ කලාපයේ ප්‍රකාශයට පත් කරන අතර, ජයග්‍රාහකයා වෙත වසරක කාලසීමාවක් සඳහා **රණවරුණ** කලාප නොමිලේ ලබාදීමට කටයුතු කරයි.

## උපකාරක පද

### හරහට

1. න්‍යෂ්ඨික විද්‍යාඥයෙකු මෙන්ම ජනාධිපතිවරයෙකු වූ අබ්දුල් කලාම් .... ජාතිකයෙකි.
3. දෑස් හැඳින්වීමට යෙදෙන පදයකි.
5. අප රටේ සුවිශේෂී පරිසර පද්ධතියකි.
7. යුද හමුදා සාමාජිකයන් මෙය පිළිපැදිය යුතුය.
8. සන්දේශ සාහිත්‍යයේ එන එක් සන්දේශ කාව්‍යයකි.
9. පහත් පෙළේ ක්‍රියාකාරකම් මෙසේ හඳුන්වයි.
11. ජපානයේ මුදල් ඒකකය වේ.
12. මුවෝ .... නිවාගැනීම සඳහා මිරිඟුව පසුපස දුවති.
16. ඉන්දියාවෙන් මෑතකදී කක්ෂගත කළ රොකට්ටුවකි.
17. වඩුකර්මාන්තයේදී භාවිත කරන උපකරණයකි.
19. පූර්ණ චන්ද්‍රයා මෙසේ හඳුන්වයි.

### පහළට

1. ශ්‍රීපාදස්ථානය වන්දනා කිරීමට යන ගමනේදී හමුවන විශේෂ ස්ථානයකි.
2. අහස යන්නට යෙදෙන වෙනත් වචනයකි.
3. මහ පොළව මෙසේද හඳුන්වයි.
4. ඉන්දියාවේ අගනුවර මෙය වේ.
6. මුද්‍රා තැබීමේදී යොදා ගන්නා අමුද්‍රව්‍යයකි.
7. තොවිල් පවිල්වලදී මේවාද කපා දොස් දුරු කරයි.
8. දේශීය වෙදකමේදී භාවිත වන සුවඳ හමන මුල් සහිත ඔසුවකි.
10. හෙන්රි ජයසේනයන්ගේ ජනප්‍රිය පරිවර්තන වේදිකා නාට්‍යයකි.
13. වර්තමාන නෙදර්ලන්ත ජාතිකයන් අතීතයේදී මෙසේ හඳුන්වා ඇත.
14. දඹදෙනිය රාජධානිය මෙම පළාත තුළ පිහිටා ඇත.
15. ඇතැම් ක්‍රියා බෞද්ධ විනයට අනුව භික්ෂුවට .... වේ.
18. සතුරු යන අරුත දේ.

# යුග දිවියට සුබ පැතුම්



පසුගියදා යුගදිවි ගමන් ඇරඹූ
සැරයන් අමරසිරි කේසීබී 3 (සෙව්) ගැහේබ
සහ නදීෂා මදුමාලි මෙනවිය



පසුගියදා යුගදිවි ගමන් ඇරඹූ
ලා/කෝ හේරත් එච්එම්එම්බී 2 ශ්‍රීලංසංබ
සහ එල්එඩ් මදුෂානි මෙනවිය




පසුගියදා යුගදිවි ගමන් ඇරඹූ
සාසෙ ප්‍රසාදිනි බීජීඑම් 2 ශ්‍රීලයුකාබ
සහ අරුණ කුමාර මහතා

## ප්‍රහේලිකා අංක 07 ජයග්‍රාහකයා

බනි II දිසානායක පීපීඩීඑම්එස්සී
2 (සෙව්) ශ්‍රීලයුවෛබ
යුහ ජනපදය
පනාගොඩ.

ප්‍රහේලිකා අංක 07 ජයග්‍රහණය හිමිකරගත් ඔබ වෙත "රණවිරුණු" මෙසේ සුබපැතුම් එක්කර සිටින අතර, ජයග්‍රහණය වෙනුවෙන් ඉදිරි කලාපයේ සිට වසර 01 ක කාලසීමාවක් සඳහා රණවරුණ සඟරාව නොමිලේ ඔබ වෙත ලබා දෙනු ඇත.

# ගීයක රස මිහිර ...




**ගීතයක්** යනු හැඟීම්බර ප්‍රකාශනයක් සේම කාර්යබහුලත්වය නිසා අවිවේකී වූ මනස නිවා සනසාලමින් සිතට සහනය ළඟාකරවීමට හැකි උත්තුංග කලා නිර්මාණයකි. අප විසින් රාජකාරි මෙන්ම පෞද්ගලික කටයුතුවල නිරතවන අතරතුර ලද විරාමයකදී ගීතයක් ශ්‍රවණය කර එහි රස විඳීමේ හැකියාව ලැබේ නම් එය, අප ලද භාග්‍යයකි.

මධුර සංගීතයක්, සුගායනීය හඬක්, හදවතට කතාකරන තනුවක් මෙන්ම සුවිශේෂී ගේය පද රචනාවක් යනාදියෙහි මනා සංකලනය තුළින් අපූර්ව ගීතයක් නිර්මාණය වේ. විශේෂයෙන්ම ප්‍රතිභාපූර්ණ ගේය පද රචකයෙකු විසින් සිය පුද්ගලික හෝ පොදු අත්දැකීමක් නැතිනම් අනුභූතියක් පදනම් කොට ගනිමින් පෘථුල කතාන්තරයක් වඩාත් රසාලිප්ත හා සංක්ෂිප්ත ලෙස ගීතයකට ගැබ් කරයි.

මෙම ගීතයේ අත්දැකීම ගත් විට සුවිශේෂී මානව සම්බන්ධතාවක සුන්දරත්වය අතීතයත් වර්තමානයත් අතර දෝලනය වන්නකි. එනම් ස්වභාවධර්මයෙහි එන ස්ත්‍රී පුරුෂ සම්බන්ධතාවය තීව්‍රවන එක් අවස්ථාවක් වන අන්‍යෝන්‍ය ප්‍රේමය, විරහව හා වර්තමානයයි. එහෙත් සමාජ සංස්කෘතිය විසින් උරුම කළ කවර හෝ නොවැලැක්විය හැකි හේතූන් මත ඔවුනොවුන් ගොඩනගා ගත් ප්‍රේමය දෙදරා ගොසින් සිය ප්‍රේම කතාන්දරයට නැවතීමේ තිත තැබීමට ඔවුනට සිදුවේ. ප්‍රථම ප්‍රේමය විවහයකින් කෙළවර වන අවස්ථා ඉතාමත් විරලවන අතර ඒ නිසාම විරහ වේදනාව අප අතරින් බෝහෝ දෙනෙකුට පොදු වූවකි.

සිය බිඳුණු ප්‍රේමයට වසර ගණනාවක් ගත වී ඇතත් ඔහු තම පෙම්වතිය සිහිකරමින් ඇය පිළිබඳව අතීතාවර්ජනයක යෙදෙන්නේ උතුරා යන සෙනහසකිනි. **මගේ ඉපැරණි පෙම්වති** ලෙස යෙදීමෙන් පද රචකයා ශ්‍රාවක මනසෙහි අතීත ප්‍රේමයක තතු මැනවින් චිත්‍රණය කරයි. එනම් ඔහු හදවතින්ම ප්‍රාර්ථනා කරන්නේ ඇය කොතැනක සිටියත් අද වන විට සෙනෙහෙබර මවක් දයාබර බිරිඳක්වී පෙරටත් වඩා සතුටින් සිටීමයි. ඒ පිළිබඳව අතීතාවර්ජනයක යෙදෙන කතානායකයා අද වන විට විවාහකයෙකි. එහෙත් තනිවූ නිමේෂයක අතීතය සිහිකැඳවන කවර හෝ සිද්ධි මාත්‍රයක සිට තමා හා පෙමින් වෙළී, එක් වහලක් යට ජීවත්වීමට පෙරුම් පිරූ තම පෙම්වතිය සිහිකරයි.

**අම්මා කෙනෙක් බිරිඳක් වෙලා**
**ලොව කාට හෝ නුඹ උරුමැති ...**

විශේෂයෙන්ම වර්තමාන සමාජය තුළ බොහෝමයක් ප්‍රේම සම්බන්ධතා ඉතාමත් ඉක්මණින් ඇතිවී ඉක්මණින් කෙළවර වන සෙයක් දක්නට ඇත. ඒ සඳහා කවර කරුණු හේතු වුවද තම මුල් ප්‍රේමය වැඩි දෙනෙකුට අමතක කළ නොහැක. එහෙත් අවාසනාවකට මෙන් ඇතැම් අය තම මුල් ප්‍රේමය කෙරෙහි ද්වේශ සහගතව බලයි. අනෙකා කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් කටයුතු කරයි. ඇතැම්විට පලිගනී. එසේ වුවද මෙම ගීතයේ කතානායකයාට ඇය කෙරෙහි ඇත්තේ දයාන්විත හැඟීමකි. චමත්කාරජනක සිතුවිල්ලකි. දැන් ඔබගේ පවුල සමග සතුටින් සිටින්න. එයයි මාගේ ප්‍රාර්ථනය වැනි කරුණාබර ප්‍රකාශනයක් මෙම ගීතය තුළින් දැක්වීම වත්මන් තරුණ පරම්පරාවට පවා සිතන්නට යමක් ඉතිරි කිරීමකි. යමක් දෙස උපේක්ෂාවෙන් බැලීමේ බෞද්ධ දර්ශනයෙන් අප ලත් ආභාසය ද ඉන් විද්‍යමාන වේ.


**මමද සැමියෙකි ඇයට අවනත**
**දෙදරුවන් ළඟ නිවන සරතැස ...**

ගීතයේ කතානායකයාද දරුවන් ඇති පියෙකු ලෙස තම පවුලේ බිරිඳගේ හා දරුවන්ගේ ජීවන සරතැස නිවමින් සාර්ථක පවුල් ජීවිතයක් ගෙවන අතර වත්මන් සබඳතාවලට බලපෑ හැකි සිය පූර්ව සම්බන්ධතා කාලයේ වැලිතලාවේ සඟවා තබන බව ඔහු සපථ කරයි. ඇතැම්විට සමාජ මාධ්‍යජාලා ඔස්සේ අපට අසන්නට දකින්නට ලැබෙන තම අතීත පෙම්වතිය කෙරහි ද්වේශයෙන් පළකරන අදහස්, ඡායාරූප මගින් සිය ආත්මයට පවා කැලැල් ඇතිකරන ප්‍රේමවන්තයින් දුර්ලභ නොවේ. එවන් කලෙක තම පූර්ව සබඳතා කිසි දිනෙක හෙළි නොකරන බව ඔහු පවසන්නේ සැබෑ

# විරු කැකුළු සිත්තම් ..








**පන්සල් ගියදා ...**
මිතුම් සසඳු තේනුවර
1 ශ්‍රේණිය එෆ්
පානදුර රාජකීය විද්‍යාලය

**පියවරුන්ගේ දිනය වෙනුවෙන්**
ඩබ් ඩී ඩිනාරා රයන්දි වික්‍රමාරච්චි
4 ශ්‍රේණිය ඩී
අනුලා විද්‍යාලය නුගේගොඩ

පෙම්වතෙකු ලෙස සමාජයේ අන්අයටද ආදර්ශයක් සපයමිනි.

**අතරමග සුණු විසුණු පැතුමක**
**මතක මිහිරියි තාම හිත යට ...**

වරින්වර මතකයට නැගෙන අතීත සැමරුම් අතර තනිවෙන ඔහු තම බිඳවැටුණු ප්‍රේමය පිළිබඳව දුක්වේ. ඒ සියලු පැතුම් සුණු විසුණු වී ගිය ආකාරය හා එම මිහිරි මතකයන් සිහිකරමින් හදවතින් හඬා වැළපෙයි. අනෙකා කෙරෙහි සැබෑ ලෙසම ප්‍රේම කළා නම් කිසිවිටෙකත් වෛරී චේතනාවක් ඇති නොවේ. එවන් වූ උසස් මානව සම්බන්ධතාවක් විස්තර කරන මෙම භාවපූර්ණ පද රචකයා එය සංක්ෂිප්තව දක්වා ඇත්තේ අතීතයේ පරවුණු මල්වල සුවඳ අදත් හදවතෙහි පවතින බව කියමිනි. එනම් ඒ ඔස්සේ රචකයා බුදුදහම අනුව සියල්ල ඇතිවී නැතිවී යන අනිත්‍යතාවද සියුම්ව ස්පර්ශ කර ඇත. එනම් තනි වූ මොහොතක තමා විඳි අතීත අත්දැකීම තුළින් සියුම් වින්දනයක් ලබන බව මෙම ගීතයෙන් පෙනේ. මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන් සිය **“කල්පනා ලෝකය”** කෘතියෙහි දක්වන පරිදි අතීතයේ අප විසින් අත්විඳි සතුටුදායක මෙන්ම දුක්ඛදායක අත්දැකීම් වර්තමානයේ සිට ආවර්ජනය කර බැලූ විට සියුම් වින්දනයක් ලැබෙන බව පවසා ඇති අතර එය සත්‍යකැයි මෙම ගීතයේ දැක්වෙන අත්දැකීමෙන්ද පැහැදිලි වේ.

අසන්නාගේ හදවතට ආමන්ත්‍රණය කරන සරල, සුගම බසකින් ලියවුණු සංවේදී ගීතයක් වන මෙය අප දැක්වූ අදහස්ද සමගින් ඔබටත් අපූර්ව ලෙස රසවිඳිය හැක. එවිට අසන්නාගේ හදවත් තුළ බුද්ධිමය නිම්වළලු පුළුල් වී නව මානයකින් සමාජය දෙස බැලීමට මෙම ගීතය පිටුවහලක් වනු ඇත.

**කපිතාන් දිල්හාරා දිසානායක**

# HAPPY Birthday TO YOU



හතරවන වියට පා තැබූ
අයත්මා විනුදි දියණියට
සු'පැතුම් පතන්නේ
කෝප්‍රල් පවතිනාමුනි
කේඒඅයිඞීඩබ් පියා සහ
මව ඇතුළු පවුලේ සැම



තුන්වන වියට පා තැබූ
ඔහාසි සවිදුනි දියණියට
සු'පැතුම් පතන්නේ
කෝප්‍රල් ශිරන්ත ඒඒආර්
පියා සහ
මව ඇතුළු පවුලේ සැම



තුන්වන වියට පා තැබූ
විනුකි ඔමල්ෂා දියණියට
සු'පැතුම් පතන්නේ
කෝප්‍රල් කුමාර ඩීඑම්එස්
පියා සහ
මව ඇතුළු පවුලේ සැම



තුන්වන වියට පා තැබූ
ඔශෙම් ෂාලෝම් පුතුට
සු'පැතුම් පතන්නේ
මා/සැ විජේකෝන්
ඩබ්එම්කේජී පියා සහ
මව ඇතුළු පවුලේ සැම



පස්වන වියට පා තැබූ
භාග්‍යා සඳමිනි දියණියට
සු'පැතුම් පතන්නේ
ලා/කෝ ප්‍රසන්න පිඑච්එම්
පියා සහ
මව ඇතුළු පවුලේ සැම



එකළොස් වියට පා තැබූ
සේනුජ චිරන්දිත් පුතුට
සු'පැතුම් පතන්නේ
කෝප්‍රල් දිසානායක
පියා සහ
මව ඇතුළු පවුලේ සැම



තුන්වන වියට පා තැබූ
ලිහාන්ශා ශනායා දියණියට
සු'පැතුම් පතන්නේ
ලා/කෝ කීර්තිරත්න
එම්පීඑම්ආර් පියා සහ
මව ඇතුළු පවුලේ සැම



තෙවන වියට පා තැබූ
විමෝක්ෂා යසස්මා දියණියට
සු'පැතුම් පතන්නේ
කෝප්‍රල් කුමාර පීඩබ්
පියා සහ
මව ඇතුළු පවුලේ සැම



තෙවන වියට පා තැබූ
මෙතුෂි විදර්ශණා දියණියට
සු'පැතුම් පතන්නේ
ලා/කෝ මුදුන්කොත්ගේ
එම්පීඑස් පියා සහ
මව ඇතුළු පවුලේ සැම



හත්වන වියට පා තැබූ
විකසිත රවිහංස පුතුට
සු'පැතුම් පතන්නේ
කෝප්‍රල් ගුණසිංහ ටීඒ
පියා සහ
මව ඇතුළු පවුලේ සැම



අටවන වියට පා තැබූ
දම්සිළුනි මනුම් විහන්සා
දියණියට සු'පැතුම්
පතන්නේ ලා/කෝ ද සිල්වා
ඒටීඑන්කේ පියා සහ
මව ඇතුළු පවුලේ සැම



දෙවන වියට පා තැබූ
ඔනලි ආරාධ්‍යා දියණියට
සු'පැතුම් පතන්නේ කෝප්‍රල්
ධර්මශ්‍රී වයිඒඑස් පියා සහ
මව ඇතුළු පවුලේ සැම



## පුතුනි, ඔබට සු'පැතුම් ....



*රං රුව දිලේ නෙළුමක සුද ගෙන යසට*
*පිංකඳ පෙනේ දෙව්ලොව සුව විඳ සැපට*
*පුන්සඳ ලෙසින් දිදුලන පොඩි මුව කමල*
*ඡන්දය වඩා සිප ගන්නෙමි ඔය නළල*

*දඟකම් කර නිතර අයියට කලත් වද*
*අයියගෙ සෙනෙහෙ නම් මල්ලිට අඩුත් නැත*
*අම්මගෙ අණට නම් කීකරු වෙලත් නැත*
*මල්ලිගෙ පෙරැත්තට මිස කළ වැඩක් නැත*

*සෙනෙහස ගුණ සුවඳ පිරී හදවත් පවුරේ*
*සුවයෙන් වැඩෙන පෙම්බර පොඩි පුතු නිබඳේ*
*දෙවසර සපිරෙනා අද සුබ උපන් දිනේ*
*ආසිරි පැතුම් පතනෙමු පොඩි පුතුට අපේ*

*පිනි බිඳු මත රැඳුණු සිසිලස ගෙන හදට*
*නෙක තරු මවන විසිතුරු පෙන්වා යසට*
*තුරුමත සුපිපි කුසුමක සුවඳක් මවන*
*ඉඳුවර පුතුනි නුඹමයි අපෙ මිණි පහන*

*කිංකිණි හඬ නගා මුව හසරැලි නන්වා*
*මොළකැටි දෙපා සලමින් දඟකම් පානා*
*අප හදවත් පුරා ඔබ සිතුවම් ගන්වා*
*පෙර සුබ සිහින ඇත නුඹ නමටම බන්ඳා*

*පිංකඳ රං මැණික මෙලොවට ආව දිනේ*
*හිඳ සත් වසර සපිරෙන සුබ උපන් දිනේ*
*ආසිරි පැතුම් පතනෙමු අපි නිරන්තරේ*
*පතනෙමි දිගාසිරි පින්බර පුතුට අපේ*

දෙවන වියට පා තැබූ චින්තන දෙණුවන් පුතුට සහ හත්වන වියට පා තැබූ සහන් ඉඳුවර පුතුට
සුබ පැතුම් පතන්නේ ලා/කෝ ඉන්දික පීවීපීපී පියා සහ මව ඇතුළු පවුලේ සැම

# පස් වසකට පසු ...



**ස්වේච්ඡා** ඒකක 84 කින් යුත් ස්වේච්ඡා බළසේනාවට අයත් සියලුම සාමාජිකයන්ගේ පාලන කටයුතු එනම් ඔවුන් යුද්ධ හමුදාවට ඇතුළත් වූ දිනයේ පටන් විශ්‍රාම යනතෙක්ද විශ්‍රාම යාමෙන් පසුවද සිය පාලන කටයුතු සිදුකරන ප්‍රධාන පරිපාලන මූලස්ථානයක් ලෙස ස්වේච්ඡා බළසේනා මූලස්ථානය හැඳින්විය හැක. අවාසනාවන්ත ලෙස 2016 ජුනි මස 05 දින මෙම මූලස්ථානය පිහිටි කොස්ගම සාලාව කඳවුරු පරිශ්‍රයේ ඇතිවූ පිපිරීමත් සමඟම ස්වේච්ඡා බළසේනා මූලස්ථානයටද දැඩි අලාභහානි සිදුවිය.

කෙසේ වෙතත් ගතවූ වසර 140 ක දිගු කාලපරිච්ඡේදය පුරාවටම ස්වේච්ඡා බළසේනාවේ මෙවන් වූ දරුණු අලාභහානියකට මුහුණ දීමට සිදුවී නොමැත. මන්දයත් භෞතිකව මෙන්ම ස්වේච්ඡා සාමාජිකයන්ගේ සියලුම වටිනා ලියකියවිලිද සමග සියල්ල සුණුවිසුණු වී යාමත් සමග ස්වේච්ඡා සාමාජිකයන් වෙත මානසිකවද ඇති කළ බලපෑම සුවිශාල වන බැවිනි. ඒ බවට අප කැමරා කාච තුළ සිතුවම් වූ ඡායාරූප සාක්ෂි දරනු ඇත.






පිපිරීමෙන් පසු ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ පාලන කටයුතු සිදුකල ආකාරය










ඕනෑම ව්‍යසනයක් හෝ හදිසි ආපදාවක් ඇති වූ අවස්ථාවක ක්ෂණිකව ඉදිරිපත් වී ජාතියේ උන්නතිය උදෙසා ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීමට ඉදිරිපත් වන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සාමාජිකයන් ලෙස, මෙම හදිසි පිපිරීමේදීද එකාවන්ව එකමුතු වී ස්වේච්ඡා සාමාජිකයන්ව සියලු දුෂ්කරතාවලට නොබියව මුහුණ දෙමින් තම රාජකාරිය ඉටුකිරීමට නොපසුබට විය. එනම් නිසි කාර්යාල පහසුකම්, නේවාසික පහසුකම් ඇතුලු අනෙකුත් පහසුකම් සියල්ල අහිමිව නැවත මුලසිට ගොඩනැගීමට සිදුවූ අතර කවර අපහසුතා ඇතිවුවද සියලු දෙනා එක්ව ඉදිකල තාවකාලික කූඩාරම්වල තම කාර්යාල පවත්වා ගනිමින් තම රාජකාරිය ඉටුකල ආකාරය තවමත් මතකයේ ඇත.

වසර 2021 ජුනි මස 05 වන දිනට එම ව්‍යසනය සිදුවී වසර 05 ක් සම්පූර්ණ වූ අතර, අද වන විට කඳවුර පරිසර හිතකාමී ලෙසත් භූමියෙන් උපරිම ප්‍රයෝජන ලැබෙන ලෙසත් සැලසුම් කළ ගොඩනැගිලි රාශියකින් සමන්විත වී ඇත. එනම් හෝරාස්ථම්භය, ස්වේච්ඡා බළසේනා ලාංඡනය සහිත ස්ථම්භය, සෙසනිළ භට නිවාස, වෛද්‍යාගාරය, බහුකාර්ය සම්පත් ගොඩනැගිලි, ශ්‍රවණාගාරය, ලේඛනාගාරය, සෙසුනිළ භෝජනාගාරය. බනි/සැරයන් නිවස්නය, රෙජිමේන්තු සැරයන් මේජර් නේවාසිකාගාරය, ක්‍රීඩා පිටිය, මුලුතැන්ගෙය ජල පිරිපහදු මධ්‍යස්ථානය යනාදී අත්‍යවශ්‍ය අංගයන්ගෙන් යුක්තවී තිබීම සතුටට කරුණකි. මෙලෙස වසර 05 ක් තුළ කඳවුරු පරිශ්‍රයකක් ලෙස නැවත ගොඩනැංවීමට මඟ පෙන්වූ සියලුම සේනාවිධායකවරුන්, නියෝජ්‍ය සේනාවිධායකවරුන් ස්වේච්ඡා බළසේනා කාර්ය මණ්ඩල ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් හා සෙසු නිලයින් මෙන්ම ස්වේච්ඡා ඒකක 84 හි සියලුම ස්වේච්ඡා සාමාජිකයන් විසින් කළ කැපකිරීම සුවිශේෂී වේ.













# අපේක්ෂාවන් එළදරමින්





යළි ගොඩනැගෙන ස්වේච්ඡා බළසේනා මූලස්ථානය වර්තමානය වන විට යුද්ධ හමුදා කඳවුරු පරිශ්‍රයක පැවතිය යුතු අනෙකුත් අත්‍යවශ්‍ය අංග වන අභිමානවත් නව පිවිසුම් දොරටුවක්, කඳවුරු භූමිය තුළ ක්‍රමානුකූල මාර්ග පද්ධතියක්, සන්නිවේදන පද්ධතියක්, ක්‍රමවත් සරඹ භූමියක්, මූලස්ථාන බලඇණි ගොඩනැගිල්ලක් යනාදියෙන් යුක්තව පියවරෙන් පියවර ඉදිවී, ඉදිකිරීම්වල අවසන් අදියරට පැමිණෙමින් ඇත.

වත්මන් සේනාවිධායකතුමන්ගේ මගපෙන්වීම හා අධීක්ෂණය මෙන්ම ස්වේච්ඡා බළසේනා මූලස්ථාන කාර්ය මණ්ඩලයේ හා ස්වේච්ඡා ඒකකවල සියලුම සාමාජිකයන්ගේ කැපවීම මෙන්ම දායකත්වය මත අද වන විට මෙම භූමියේ අලංකාර කඳවුරු පරිශ්‍රයක සලකුණු මතුවෙමින් ඇත. ඒ නිසාම නුදුරු අනාගතයේදී මෙම සියලු කටයුතු නිමවී ස්වේච්ඡා බළසේනා මූලස්ථානය අංගසම්පූර්ණ කඳවුරක් ලෙස ගොඩනැංවෙන කර්තව්‍යය ඉටුවන තුරු ස්වේච්ඡා සාමාජිකයන් ලෙස නිසි දායකත්වය සපයමින් අපේක්ෂා දල්වා බලාසිටිමු.

